# දෙල්ගොඩ සමූල ඝාතනය
# සහ
# නීතිය නොතැකීම

ආසියානු මානව හිමිකම් කොමිසම,
පාර්ලිමේන්තු විවාදයක් ඉල්ලා සිටී

නීතිඥ බැසිල් ප්‍රනාන්දු

**දෙල්ගොඩ සමූල ඝාතනය සහ**
**රටේ පවත්නා වූ නීතිය නොතැකීම**

*පළමු මුද්‍රණය 2007*

© *බැසිල් ප්‍රනාන්දු*


පිටකවරය : කේ.ඩබ්. ජනරංජන

ඡායාරූප : අජිත් මදුරප්පෙරුම

පිටු සැකසුම : රාවය

මුද්‍රණය : රාවය මුද්‍රණ හා ප්‍රකාශන
අංකː 83, පිලියන්දල පාර, මහරගම

ප්‍රකාශනය : ශ්‍රී ලංකාවේ වධහිංසාව තුරන්කිරීමේ ජනසන්ධානය
ආසියානු මානව හිමිකම් කොමිසම

# අන්තර්ගතය

හැඳින්වීම

1. රට තුළ පවත්නා වසංගතයක් හා සමාන නීතිය නොතැකීම 7

2. නීතියේ ආධිපත්‍ය පිළිබඳව අත්‍යාවශ්‍ය වූ පාර්ලිමේන්තු විවාදය 13

*පාර්ලිමේන්තුවේ කථානායක සහ සියලු මන්ත්‍රීවරුන් වෙත, නීතියේ ආධිපත්‍යයට අදාළ කරුණු පිළිබඳ පාර්ලිමේන්තු විවාදයක් ඉල්ලා යොමුකරන විවෘත සංදේශය*

3. පොලිසිය ශක්තිමත් කිරීම සහ නීතිය නොතකා හැරීමට විසඳුම හොඳින් හෝ නරකින් කටයුතු කිරීම නොවන බව 19

4. පොලිස්පති නීතියට යටත්ය. ඊට පහළින් සිටින්නෙකි 27

5. ශ්‍රී ලංකාවේ ප්‍රමාණවත් අපරාධ විමර්ශකවරුන් නොමැත. කුමක් කරමුද? 31

6. මානව හිමිකම් සුරැකීමට ශ්‍රී ලංකාවේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය තුළ පවත්නා මූලිකාංග ප්‍රතිසංස්කරණය අත්‍යාවශ්‍යයි 35

7. මිනීමැරීම සාධාරණීකරණය කරන්නා වූ මතභේදාත්මක විනිශ්චයක් 57

*- දෙල්ගොඩ පවුලේ සමූහ ඝාතනයට අදාළ සැකකරුවන් දෙදෙනෙකු මරාදැමීම සාධාරණීකරණය කළ විනිශ්චය පිළිබඳව අධිකරණ සේවා කොමිෂමේ ලේකම්ට යොමු කළ ලිපිය*

# හැඳින්වීම

එකම පවුලේ සාමාජිකයින් පස් දෙනෙකු ඔවුන්ගේම නිවහන තුළ කපා කොටා මරා දැමීමක් 2007 මැයි 26 වන දින සිදු විය. මෙසේ මරා දැමීමට හේතුව ලෙස වාර්තා වන්නේ ටික කාලයක් තිස්සේ වර්ධනය වෙමින් පැවති ඉඩම් ආරවුලකි.

සිද්ධියට පසුදින අසල්වැසියන් නොවන පිරිසක් බස් රථයකින් පැමිණ ගෙවල් තුනක් ගිනි බත් කළ බව වාර්තා වේ. එදිනම පොලිසිය සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන පැය කිහිපයකට පසුව මරා දැමීය. මෙම මරා දැමීම විද්‍යුත් මාධ්‍ය මගින් ජාතියට දැනුම් දුණි. පැය 24 ක් ඇතුළත ප්‍රදේශය භාර මහේස්ත්‍රාත්වරයා මෙම පුද්ගල ඝාතන 2ක ආත්මාරක්ෂාව සඳහා සිදු කළ බවට සාධාරණීකරණය කරමින් නිවේදනයක් නිකුත් කළේය.

මෙම සිද්ධිය හට ගෙන සති දෙකක කාලයක් ඇතුළත විවිධ ප්‍රදේශයන්හි පවුල්වල මෙවැනි මරා දැමීම් කිහිපයක් සිදුවිය. පවතින්නා වූ අන්තයටම ගිය සිහි විකලත්වය පිළිබිඹු කරන්නක් ලෙස, අසාමාන්‍ය පරිදි සිදු වනු අපරාධ දැක්විය හැක.

මෙම සිද්ධියට හට ගැනීමෙන් පසුව ආසියානු මානව හිමිකම් කොමිසම ප්‍රකාශන මාලාවක් නිකුත් කළේය. මෙම කුඩා පොත් පිංචට එම ප්‍රකාශද, ඊට පෙර නිකුත් කළ ප්‍රකාශ සහ අධිකරණ සේවා කොමිසමේ ලේකම්ට ලියන ලද ලිපියද අන්තර්ගතය. මෙම කරුණ සහ පවත්නා නීතිය නොතැකීමේ වාතාවරණය සමඟ ප්‍රබුද්ධ ලෙස ගනුදෙනු කිරීමේ උපාය මාර්ග පිළිබඳව පාර්ලිමේන්තු විවාදයක් පවත්වන ලෙස ඉල්ලා පාර්ලිමේන්තුවේ කතානායකට සහ සියලු මන්ත්‍රීවරුන්ට ආසියානු මානව හිමිකම් කොමිසම විවෘත සංදේශයක් ඉදිරිපත් කළේය. ආසියානු මානව හිමිකම් කොමිසම, වසර 10 ක් පුරා රටේ නීතියේ ආධිපත්‍යයේ පවත්නා අසාමාන්‍ය බිඳ වැටීම අඛණ්ඩව පහදා දුන් අතර, මෙම තීරණාත්මක කරුණ නොසලකා හැරීම, රට සිතාගත නොහැකි ආකාරයට විනාශ මුඛයට යෑමක් බව පෙන්වා දුන්හ. අපි මෙම කුඩා පොත් පිංච මේ පිළිබඳ ඇති විය යුතු මහජන කතිකාවතකට අවශ්‍ය දායකවීමක් ලෙස ප්‍රකාශයට පත් කරමු. විසඳුමක් අවශ්‍ය නම් මෙම මහජන කතිකාවතද අත්‍යාවශය වූවකි.

**නීතිඥ බැසිල් ප්‍රනාන්දු**
**අධ්‍යක්ෂ,**
**ආසියානු නීති සම්පත් කේන්ද්‍රය**

# රටේ පවතින නීතිය නොතැකීමේ වසංගතය



ආසියානු මානව හිමිකම් කොමිසම, ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය පිළිබඳව වසර ගණනාවක සිට නිරීක්ෂණය කළේ ය. එපමණක් නොව මෑතකදී ඇති වූ ප්‍රවණතාවයන්ද ඔවුන්ගේ තියුණු නිරීක්ෂණයට භාජනය විය. මේ තත්ත්වය කළ බලපෑම් ප්‍රතිපලයක් ලෙස පහත ප්‍රකාශ නිකුත් වේ. එනම්, ශ්‍රී ලංකාව මුහුණ දී සිටින්නේ, අතිශයෝක්තියක් නොවන නීතිය නොතැකීමේ වසංගත අවස්ථාවකටයි.

පැහැරගැනීම සහ බලය යොදා සිදුකරන අතුරුදහන්වීම්, ජන ජීවිතයේ සෑම අංගයකටම පැතිරුණු අපරාධ, මුළු පවුලම විනාශ කර දමමින් සිදුවන සිවිල් සමාජයේ ඉහළ යන ප්‍රචණ්ඩත්වය, සමහර පුරවැසියන් නීතිය සියතට ගැනීම මගින් ගල් ගසා මරා දැමීම වැනි ක්‍රමවේදයන් භාවිතා කොට අපරාධ සිදු කළ බවට චෝදනා ලැබූවන් මරා දැමීම දිනට සිදුවෙමින් පවතී. මෙමගින් නීතිය නොතකන වාතාවරණය මැනවින් විද්‍යාමාන කරනු ලැබේ.

මින් පෙර කවරදාකවත් නිරීක්ෂණය නොකළ පරිද්දෙන් පොදු ජන ජීවිතයේ සෑම ක්ෂේත්‍රයකටම

දූෂණය පැතිරී ගොස් ඇත. වගකිවයුතු තනතුරු දරන සහ ඉහළ ශ්‍රේණිවල පොලිස් නිලධාරීන් අත්විඳින තම ජීවිත පිළිබඳ අනාරක්ෂිත බව මහා පරිමාණයෙන් ඉහළ ගොසිනි.

මෙම තත්ත්වය, තවදුරටත් කළකිරීම දක්වා වර්ධනය කිරීමෙහිලා නිවැරදි මිණුම්දඬු ලෙස පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නොසලකා හැරීම දැක්විය හැකිය. ආණ්ඩුව තවදුරටත් නීතිය හා සාමය පවත්වා ගැනීමේ වගකීම අතපසු කරයි. පෙනෙන්නට තිබෙන පරිදි ආණ්ඩුවට තත්ත්වය පාලනය කිරීමේ හැකියාවද නොමැත.

සිවිල් අධීක්ෂණ කමිටුවේ ප්‍රකාශකයකු බ්‍රිතාන්‍ය ගුවන් විදුලි සේවයට පැහැර ගැනීම් පිළිබඳ සිද්ධීන් 3 ක් ගැන සඳහන් කළේය. මෙවැනි පැහැර ගැනීම් වැළැක්වීමෙහි ලා ඔවුන්ගේ භූමිකාව කවරේදැයි බ්‍රිතාන්‍ය ගුවන් විදුලි සේවය විසින් අසනු ලැබේ. ප්‍රකාශකයාගේ පිළිතුර වූයේ, 'අපිට කරන්න පුළුවන් ලැබෙන පැමිණිලි වගකිවයුත්තන්ට වාර්තා කිරීම, වින්දිතයින්ගේ පවුලේ සාමාජිකයින්ව ඒ හා සමානව පැමිණිලි කිරීමට පොලිසියට යොමු කරන්න පුළුවන්. මේ දේවල් සිදුවෙනවා. ඒ වුනත් පොලිසියට විමර්ශන පැවැත්වීමේ නොහැකියාව තිබෙනවා යන්නයි.

ශ්‍රී ලංකාවේ පොලිසිය තුළ පවත්නා මූලික බිඳ වැටීම ආසියානු මානව හිමිකම් කොමිසම විසින් වසර 10 ක කාලයක සිට අඛණ්ඩව පෙන්වා දී ඇත. පැහැදිලි කරන ලදි. වසර කිහිපයක් අධ්‍යයනයෙන් පසුව අප පොලිසිය අක්‍රීය ආයතනයක් ලෙස අර්ථකතනය කළේය. පැහැරගෙන යාම් සහ අතුරු දහන්වීම්වලදී විමර්ශන පැවැත්වීමෙහි ලා මෙම අක්‍රීය බව බලපායි.

එපමණක් නොව සිවිල් කටයුතු වලදීත් පොලිස් අධීක්ෂණවලදීත් මෙය බලපායි. එනම් සුළු ගෘහස්ත, අර්බුදවල ප්‍රතිඵලය මුළු පවුලම විනාශ කර දැමීමය. මේ තත්ත්වය නිරූපණය වූ අවස්ථාවක් ලෙස, ගිය සතියේ හිර ගෙදරින් නිදහස්ව ගෙදර පැමිණි සිරකරුවකු විසින් මුළු පවුලම මරා දැමීම දැක්විය හැකිය. මෙම මරා දැමීම සිදුවීමට මොහොතකට පෙර, මෙම ආරවුල පිළිබඳව අසල්වැසියන්ට දැනගන්නට ලැබිණ. ඔවුහු පොලිසියට සහ අනෙක් වගකිවයුත්තන්ට පැමිණිලි කළහ. ඔවුන්ට සහය වීමට කිසිදු ක්‍රියමාර්ගයක් ගැනුණේ නැත. එහි ප්‍රතිඵලය මුළු පවුලම බිහිසුනු ලෙස විනාශ වීමයි.

නීතිය සියතට ගත් කළහකාරී පිරිස් අපරාධකරුවන් ලෙස චෝදනා ලැබූවන් මරා දැමූ අවස්ථා දෙකක් මෑත සති කිහිපය තුළ සිදු විය. සෑම ස්ථානයකින්ම සොරකම් සහ මංකොල්ලකෑම් වාර්තා වෙයි. මීට අගවිනිසුරුවරයාගේ නිවසේ සිදු වූ සොරකමක්ද ඇතුළත්ය. අගවිනිසුරුවරයාගේ නිවසට ආසන්නයේ පිහිටි රජයේ දේපලකට අයත් දුර්ලභ හා වටිනා ගස් සොරෙන් කපනු ලැබීය. මේ සා සුවිශාල ගස් සොරකම් කිරීමේ සිද්ධියක් හොඳින් සැලසුම් නොවී, සංවිධානය නොවී සිදු කළ නොහැක. ඉහත සියලු චෝදනාවලට කිසිවෙකුගේ අත්අඩංගුවට නොගත්හ. එපමණක් නොව යම් අත්අඩංගුවට ගැනීමක් සිදු වූවා නම් සිදුවූයේ සැබෑ අපරාධකරුවන්ට ආදේශකයක් ලෙස හා යමක් සිදුකරන ලද බවට හුදු හැඟීමක් ජනිත කිරීමට පමණි.

රජයේ කටයුතුවලදී පොලිසිය නඩත්තු කිරීම පිළිබඳ වගකීම පොලිස්පතිට, නියෝජ්‍ය පොලිස්පති වැනි පොලිසියේ ඉහළ තනතුරුවල නිලධාරීන්ට සහ ජාතික කොමිසමට ඇත. නමුත් එම වගකීම ඉටු

නොවන තරම්ය. මෙම වගකිවයුත්තන්ට පොලිසියේ අක්‍රියත්වය වෙනස් කළ නොහැකි දෙයකි. ජනතාවට, මෙම තත්ත්වය පිළිබඳ පැමිණිලි කර වෙනසක් ඇති කිරීමට කිසිවෙක් නැත. මෙම අක්‍රියත්වය පිළිබඳ හැඟීම සමහර අපරාධකරුවන්ට තම කටයුතු දඬුවම් නොලැබ නිදහසේ කර ගැනීමට අවශ්‍ය ධෛර්යය සපයයි. අද දවසේ තත්ත්වය වඩාත් නරක අතට හැරවීමෙහි ලා සමහර අපරාධවලට සම්බන්ධ කොටස් පොලිස් නිලධාරීන්ගේ පිහිට පැතීමද, සමහර අවස්ථාවලදී ඉහළ තනතුරු දරන පොලිස් නිලධාරීන් ඔවුන්ගේ කොටස්කරුවන් ලෙස ක්‍රියාකිරීමත් දැක්විය හැකිය. අපරාධවලට පොලිසිය හවුල් වීමේ ක්‍රියාදාමය, වෙනස් කළ නොහැකි පරිදි පැළපැදියම් වී ඇත. මෙම අර්බුදය බිහිසුණු විනාශයකට හේතුවන බව තේරුම් නොගැනීම ශ්‍රී ලාංකීය සමාජය සිතා ගැනීමට නොහැකි ආකාරයක අනතුරට ලක්වීමකි.



නීතිය හා සාමය සම්බන්ධයෙන් ගත් විට ආණ්ඩුවට, අපරාධ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ කැමැත්තක් නැතිනම් හැකියාවක් නොමැත. අකමැත්තට බලපාන කරුණු කිහිපයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 17 වන සංශෝධනය ආණ්ඩුව ක්‍රියාත්මක නොකරයි. එමගින් වර්තමාන ආණ්ඩුව ප්‍රසිද්ධියේ පිළිබිඹු කරන්නේ, පොලිසියට නීතිවිරෝධී කටයුතුවල නිරත වීමට ඉඩදීම සහ ඔවුන්ගේ අධිකාරියෙන් පිටත කටයුතුවල නිරතවීමට ඉඩදීම මගින් තමන්ට තම දේශපාලන අරමුණු එනම්, මැතිවරණවලදී සහ විරුද්ධවාදීන් සමඟ නීතිවිරෝධී ගනුදෙනු කිරීමේ හැකියාව ලැබෙන බවයි. කොළඹදී සිදුවූ දේශපාලන ඝාතන එනම්, පාර්ලිමේන්තුවේ ද්‍රවිඩ ජාතික මන්ත්‍රීවරයකු වූ නඩරාජා රවිරාජ් මරා දැමීම සහ අපරාධ විමර්ශන ඒකකය දේශපාලන

විරුද්ධවාදීන්ට සහ මාධ්‍යවේදීන්ට කරන අතවර හා හිරිහැර ප්‍රසිද්ධ සිද්ධීන් ගණනාවකදීම ප්‍රකාශයට පත් විය.

අපරාධ විමර්ශන ඒකකයේ හැකියාවෙන් යුත් නිලධාරීන් මාරු කිරීම සිදුවිය. මේ තත්ත්වය දෙපාර්තමේන්තුව තුළ තම අධිකාරිය අයුතු භාවිතයට ගන්නා නිලධාරීන්ගේ ආකල්පවලට, ආණ්ඩුව අනුබල දීමකි. අනෙක් අතට ආණ්ඩුව, රජයේ හමුදා සහ අනෙකුත් සන්නද්ධ කණ්ඩායම් සිදුකරන අපරාධ සමඟ ගනුදෙනු කිරීමට අකමැතිය. මෙවැනි ප්‍රවණතා ආණ්ඩුවේම දේශපාලන අධිකාරීත්වය පිළිබඳ බරපතළ අර්බුද නිර්මාණය කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 17 වන සංශෝධනය මගින් ඇති කළ ආයතනය, විධිමත්ව ක්‍රියාත්මක වීමට තිබූ සීමිත ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනද ඉවත් කළ ආණ්ඩුවට, වර්තමාන වාතාවරණය සමඟ ගනුදෙනු කිරීමේ නොහැකියාවක් ඇත.



නීතිය සහ සාමය රැකීමට ආණ්ඩුව අකමැතිවීම, එහි ලා දක්වන නොහැකියාව මගින් පාලනය කිරීමේ ව්‍යවස්ථානුකූලභාවය සහ ජනතාවගේ පරමාධිපත්‍ය ප්‍රධාන වශයෙන් විනාශ කරයි. ශ්‍රී ලංකාවේ උද්ගතව ඇති වාතාවරණය සම්බන්ධයෙන් විරුද්ධ දේශපාලන පක්ෂ හා සිවිල් සමාජයේ කොටස් අතර ජනප්‍රිය සංවාදයක් පවතී. මෙහිදී නීතිය නොසලකා හැරීම සහ එය වසංගතයක් දක්වා වර්ධනය වීම පිළිබඳ ප්‍රමුඛ ලෙස සැලකිල්ල දැක්විය යුතුය. මෙම වසංගතය සමඟ ගනුදෙනු කිරීමට ඉතා දැඩි උපාය මාර්ගයක් අවශ්‍යයි. එවැන්නක් දක්වන අසමත් බව සමාජය උපකල්පනය කළ නොහැකි වේදනාකාරීත්වයකට තල්ලු කිරීමකි.

වර්තමාන අර්බුදයට සම්පූර්ණ විසඳුමක් ඉදිරිපත් කිරීමට ආසියානු මානව හිමිකම් කොමිසමට

නොහැක. එහෙත් එය සැමගේ අවධානයට ලක් කළ හැකිය. පොලිසියේ අක්‍රිය බව සමඟ ගනුදෙනු කිරීමට ලබාදිය හැකි අවම විසඳුම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට සාමාජිකයින් පත් කිරීමයි. මෙය පමණක්ම විසඳුම වේය යන්න අදහසක් නොවේ. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට සාමාජිකයින් පත් කිරීම වත්මන් වාතාවරණය සමඟ ගනුදෙනු කිරීමේ වගකීම භාර ගැනීමට හැකි අධිකාරිය නිර්මාණය කරයි. මෑතකාලයේදී ජාත්‍යන්තර ප්‍රජාව ශ්‍රී ලංකාවට බලපාන කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට උනන්දුවක් දක්වා ඇත. ඔවුන් මෙහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට අදාළ කරුණ සහ අතිශයෝක්තියක් නොවන එනම් නීතිය නොතැකීමේ වසංගත තත්ත්වයට ප්‍රධාන වැදගත්කමක් ලබා දිය යුතුය.

# නීතියේ ආධිපත්‍ය පිළිබඳව අත්‍යාවශ්‍ය වූ පාර්ලිමේන්තු විවාදය

පාර්ලිමේන්තුවේ කථානායක සහ සියලු මන්ත්‍රීවරුන් වෙත, නීතියේ ආධිපත්‍යයට අදාළ කරුණු පිළිබඳ පාර්ලිමේන්තු විවිදයක් ඉල්ලා යොමු කරන විවෘත සංදේශය.



*වි.ජ.මු. ලොකුබණ්ඩාර,*
*කථානායක තුමා*
*ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,*
*ශ්‍රී ලංකාව.*

*2007 මැයි මස 25*

***ශ්‍රී ලංකාව් පාර්ලිමේන්තුවේ කථානායකතුමා හා සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙතයි.***

*මා මේ ලිපිය ලියන්නේ ආසියානු මානව හිමිකම් කොමිසම වෙනුවෙනි. මෙම ලිපියට අදාළ කරුණු වන්නේ දෙල්ගොඩ ඉඩම් පිළිබඳව සිවිල් ආරවුලක් සම්බන්ධයෙන් එකම පවුලක පස් දෙනෙකු මරා දැමීමත්, ඉන්පසු ජන සමූහයක් විසින් අසල ගෙවල් තුනක්ම ගිනි තබා දැමීමත්, පවුල් ඝාතනයට සම්බන්ධ යයි කියන දෙදෙනෙකු*

අත්අඩංගුවට ගැනීමෙන් පසු පොලිසිය විසින් මරා දැමීමත් යන සිද්ධීන්ය.

එකිනෙකට බැඳී පවතින මෙම සිද්ධීන් තුන - පවුල් ඝාතනය, ගෙවල් ගිනි තැබීම හා සැකකරුවන් මරා දැමීම - හා සමාන අපරාධය අප කොමිසම දන්නා තරමට ආසියාවේ කොතනකදීවත් මෑතකදී වාර්තා වී නැත. මෙම සමස්ත සිද්ධිය ලංකාවේ නීයේ ආධිපත්‍යය ගිලිහී යාම පිළිබඳව පැහැදිලි ප්‍රතිරූපයක් නිර්මාණය කරයි. සාමාන්‍ය ප්‍රමාණයෙන්වත් නීතිය ක්‍රියාත්මක වන හා සිවිල් සමාජය තමන් අවට ඇති ප්‍රශ්න කෙරෙහි තරමකවත් මැදිහත්වීමක් කරන සමාජ රටාවක් තුළ මෙවැනි සිදුවීමක් සිදුනොවන බව කිවහැකිය.

ඉඩම් ආරවුලක්, පවුල් ඝාතනයක් දක්වා වර්ධනයවීම ක්ෂණයකින් හෝ ස්වල්ප කාලයක් ඇතුළත සිදුවූවා යයි සිතීමට ඇති ඉඩකඩ අඩුය. සාමාන්‍යයෙන් ආරවුලක් මෙවැනි ඝාතනයක් දක්වා වර්ධනය වන්නේ සෑහෙන කාලසීමාවක් ඇතුළතදීය. එම කාලසීමාව තුළ රටේ නීතිය ක්‍රියාත්මක කරන සංස්ථා, විශේෂයෙන් පොලිසිය හා අනිත් අතින් අවට පරිසරයේ සිවිල් සමාජය සාමාන්‍ය ප්‍රතික්‍රියා කරන ආකාරයත්, ස්වාභාවික තත්ත්වයක තිබුණා නම් මෙවැනි සිදුවීමක් ලේසියෙන් වැළකී යාමට ඉඩ තිබිණි. යම් ආරවුලකදී පොලිසියේ සහාය පැතීම සාමාන්‍ය සිරිතකි. පොලිසියට කරන කට උත්තරයක් හෝ පැමිණිල්ලක් මගින් ආරවුලක් නිරාකරණය කර ගැනීමට බොහෝ දුරට හැකිය යන විශ්වාසය මහජනතාව තුළ පවතිනතාක් දුරට, ආරවුල් මහා අපරාධ බවට පත්වීමට ඇති ඉඩ කඩ අඩුය.

දෙල්ගොඩ සිද්ධියෙන් ප්‍රකාශයට පත්වන්නේ, එම විශ්වාසයේ සැලකිය යුතු පළුදුවීමක් පවතින බව හෝ එම විශ්වාසය සනාථ වන ආකාරයකින් ප්‍රදේශයේ පොලිසිය විසින් ක්‍රියාත්මක වී නැති බවය. මෙම සිද්ධිය රට තුළ සාමාන්‍ය ආකාරයේ පැමිණිලි කිරීම මගින්, පොලිසියේ සහයෝගය ලබාගැනීමෙන් ප්‍රශ්න නිරාකරණය කර ගැනීම පිළිබඳව ඇති විශාල ගැටලු ඉස්මතු කරයි. ඒ අනුව මෙය හුදකලා සිද්ධියක් නොවේ. මීට සමාන සිද්ධීන් නිතරම දූන් ලංකාවේ නොයෙක් පළාත්වලින් වාර්තා වේ. ලංකාවේ මහා අධිකරණයේ විනිසුරුවරයෙකු වූ සරත් අඹේපිටිය මහතා මරා දැමීමත් අධිකරණයක් ඉදිරියට සාක්ෂි දීමට නියමිතව සිටි ජෙරාඩ් පෙරේරා එසේ සාක්ෂි දීමට පෙර මරා දැමීමත් එකම ක්‍රියාවලිය සංකේතවත් කරන තවත් සිදුවීම් දෙකකි.

පවුලේ ඝාතන සමග සිදු වූ ඊළඟ සිද්ධිය වූයේ අසල්වාසී ගම් වැසියන් විසින් සිද්ධිය වූ ස්ථානය අසල ගෙවල් තුනක්ම ගිනි තබා දැමීමය. මෙම සිද්ධිය තුළින් ද, පැහැදිලි වන්නේ මහා අපරාධයක් ඉදිරියේ අසරණ වූ ජනතාවකගේ ප්‍රතික්‍රියාවන්ය. සමහර විට මෙවැනි ක්‍රියාවන්ට සාමාන්‍ය ජනයා පෙලඹෙන්නේ මෙවැනි මහා අපරාධයක් වළක්වා ගැනීමට නොහැකිවීම පිළිබඳ ඔවුන් තුළම ඇතිවන කළකිරීම නිසාය. සිවිල් සමාජයට තමන් අවට පරිසරයේ ඇති විය හැකි වැරදි මග හරහා ගැනීමට තරම් මැදිහත් වීමක් කිරීමට ආත්ම ශක්තිය නැති වී යන්නේ, ඉතාමත් අස්වාභාවික මට්ටමකට නීතිය පිරිහී ගියායින් පසුවය. එවැනි අවස්ථාවල මහජනතාව තමන්ගේ කලකිරීම ප්‍රචණ්ඩ ක්‍රියා මගින් ප්‍රකාශයට පත් කරයි.

පසුව සිදු වූ තෙවන සිදුවීම නම්, අපරාධයට සැකකරුවන් ලෙස අත්අඩංගුවට ගත් දෙදෙනෙකු පොලිසිය විසින් වෙඩි තබා මරා දැමීමයි. එම මරා දැමීම මෙම සැකකරුවන් පැනයාමට ගත් උත්සාහයක් නිසා සිදු වූවා යැයි කීවත්, එවැනි කතාවක් අසන්නට ලැබෙන මුල් වතාව මෙය නොවේ. දැන් නිතරම පාහේ පැනයෑමට උත්සාහ කරන සිරකරුවන් මරා දැමීම පිළිබඳ කතා වාර්තා වේ.

මේ සමස්ත සිද්ධිය ඔබ නියෝජනය කරන උත්තරීතර පාර්ලිමේන්තුවේ අවධානය කෙරෙහි යොමුකර සිටින්නේ රටක නීතියේ ආධිපත්‍යය රැකීමේත්, නීතිය පිළිබඳව විශ්වාසය මහජනතාව තුළ රැකගැනීමේත්, අවසාන වගකීම රැඳෙන්නේ පාර්ලිමේන්තුව මත නිසාය. පාර්ලිමේන්තුවක පැවැත්මම, සාධාරණීකරණය වන්නේ නීතියේ ආධිපත්‍යය රැකගැනීමටත්, නීතිය පිළිබඳව මහජන විශ්වාසය රැකගැනීමටත් හැකිවන ප්‍රමාණයට පමණය.



මේ තත්ත්වය යටතේ, මේ සිද්ධිය පිළිබඳ නොතකා හැරීම ප්‍රඥාගෝචර ක්‍රියාවක් වන්නේ නැත. මෙම සිද්ධිය පිළිබඳව බැරෑරුම් ක්‍රියාමාර්ගයක් ගැනීම මගින්, රටේ නීතිය රැක ගැනීම පිළිබඳව පැන නැගී ඇති විශාල ගැටලු නිරාකරණය කර ගැනීමට අවස්ථාවක් නිර්මාණය කර ගැනීම වඩාත් ප්‍රඥාගෝචර ක්‍රියාමාර්ගය වේ. එම නිසා ගතයුතු සුදුසු ක්‍රියාමාර්ග පාර්ලිමේන්තුවේ බලක්ෂේත්‍රය පිළිබඳව හොඳින් දන්නා ඔබ විසින්ම තීන්දු කළ යුතුය. පහත සඳහන් යෝජනා අප විසින් කරන්නේ නීතිය රැකීමේ මූලෝපායයක් පාර්ලිමේන්තුව තුළම වර්ධනය වේය යන විශ්වාසය මත හා ඒ සඳහා යම් රුකුල් දීමක් කිරීම සඳහාය.

ආසියානු මානව හිමිකම් කොමිසම, ජාත්‍යන්තර මානව හිමිකම් වගකීම් මත පිහිටා පහත සඳහන් යෝජනා කෙරෙහි ඔබගේ අවධානය යොමු කරයි.

අ. දෙල්ගොඩ සිද්ධියට අදාළ සමස්ත ක්‍රියාදාමය පිළිබඳ විවාදයක් පාර්ලිමේන්තුව තුළ පවත්වන ලෙසත්,

ආ. පාර්ලිමේන්තු යෝජනාවක් මගින් මේ සිද්ධිය පිළිබඳව නිසි වාර්තාවක් ලබාදිය හැකි රටේ පරිණත පුද්ගලයන් කණ්ඩායමකින් සමන්විත මණ්ඩලයක් පත් කොට, ඉතා කෙටි කාලයක් තුළ මේ සමස්ත සිද්ධිය පිළිබඳ වාර්තාවක් ලබා ගන්නා ලෙසත්,

ඇ. නීතිය ක්‍රියාත්මක කරවා ගැනීම නැවත පණ ගන්වා ගැනීම සඳහා කමිටුවක් පත්කර, කිසියම් ශීඝ්‍රගාමී මූල්‍යයෝපායන් හා ක්‍රියාමාර්ගයන් වර්ධනය කර ගන්නා ලෙසත්ය.



ලංකාවේ තත්ත්වය පිළිබඳව කාලයක් පුරා කිට්ටු අධ්‍යයනයක යෙදී සිටින අප කොමිසමේ අදහස වන්නේ ලංකා ව්‍යවස්ථාවේ දාහත් වන සංශෝධන යටතේ ව්‍යවස්ථාදායක සභාව හා එම සංශෝධනය අදාළ කොමිසන් සභා ක්‍රියාත්මකව තිබුණා නම්, දෙල්ගොඩ සිද්ධිය වැනි සිද්ධීන් වළක්වා ගැනීමට හැකියාවක් පැවති බවය. දැන් පැන නැගී ඇති තත්ත්වය වෙනස් කර ගැනීම සඳහා අවම ක්‍රියාමාර්ගයක් වන්නේ, ව්‍යවස්ථාදායක සභාව හැකි ඉක්මනින් ක්‍රියාත්මක කරවා ගැනීමට පියවර ගැනීමය.

ලංකාවේ නීතිය කඩා වැටීම පිළිබඳව දැන් වසර ගණනාවක් තිස්සේම, අප කොමිසම

විසින් ලංකාවේ ජනාධිපතිවරුන්ට හා වෙනත් බලධාරීන්ට නිතරම මතක් කිරීම් කර ඇත. එහෙත් රටේ නීතිය තවත් කඩා වැටීමට ඉඩ හැරීම මිස, වෙනත් සාධාරණීය ක්‍රියාමාර්ගයක් ගත් බවට කිසිදා සාක්ෂියක් නැත. මෙම මහා බරපතළ ප්‍රශ්නය සම්බන්ධයෙන් රටේ අවසාන ආරක්ෂාව රැඳී ඇත්තේ පාර්ලිමේන්තුව මතය යන්න දැන් ඉතා පැහැදිලිය. රට අරාජික භාවයෙන් ගලවා ගැනීමත් රටේ ස්වෛරීභාවය හා නිදහස අර්ථ ගැන්වීමත් දැන් භාරව ඇත්තේ ඔබ ගරුතර සභාව විසින් රටේ නීතිය රැකගැනීමට ශීඝ්‍රගාමී ක්‍රියාමාර්ගයක් ගැනීම මතය. ඒ සඳහා අවශ්‍ය මූල්‍යයෝපාය හා ක්‍රියා මාර්ගය ඔබ සභාව විසින් නිර්මාණය කර ගන්නවා ඇතැයි අප විශ්වාස කරන අතර, එසේ ගන්නා සියලුම ක්‍රියාමාර්ගයන්ට සිවිල් සමාජයේ උද්යෝගිමත් ප්‍රතිචාරයක් ලැබෙන බව අපට සහතිකය. ජාත්‍යන්තර ප්‍රජාවගේ සහයෝගයද මෙම කරුණ සම්බන්ධයෙන් ඔබට ලැබෙනවා නොඅනුමානය.

මෙයට,
විශ්වාසී,

බැසිල් ප්‍රනාන්දු
(විධායක අධ්‍යක්ෂ)

# පොලිසිය ශක්තිමත් කිරීම සහ නීතිය නොතකා හැරීමට විසඳුම "හොඳින් හෝ නරකින් කටයුතු කිරීම නොවන" බව

ඉඩම් ආරවුලක් සම්බන්ධයෙන් දෙල්ගොඩ එකම පවුලේ සාමාජිකයින් පස් දෙනෙකු මරා දමනු ලැබීය. කළහකාරී පිරිසක් ඉන්පසුව අවට පිහිටි ගෙවල් තුනක් ගිනිබත් කළේය. ඒ හා සමගම පොලිස් අත්අඩංගුවේ සිටි චූදිත සැකකරුවන් දෙදෙනෙකු මරා දමනු ලැබීය. මෙම මරා දැමීම සාධාරණ මනුෂ්‍ය ඝාතන ලෙස මහේස්ත්‍රාත්වරයා ප්‍රකාශයට පත් කළේය. සියල්ල ශ්‍රී ලංකාව තුළ සැලකිය යුතු සංවාදයකට බඳුන් වේ.



ආසියානු මානව හිමිකම් කොමිසම පාර්ලිමේන්තුවේ කථානායකට සහ සියලු මන්ත්‍රීවරුන්ට විවෘත සංදේශයක් ඉදිරිපත් කළේය. එතුළින් රට තුළ වර්ධනය වෙමින් පවතින සියලු දෙනා මැනවින් දත් නීතිය නොතැකීමේ ප්‍රවනතාව සමඟ ගනුදෙනු කළ හැකි සම්පූර්ණ ක්‍රියාදාමයක් සංවර්ධනය කර ගැනීම පිණිස ඒ දැක්මෙන් යුතුව සිදුකරන්නා වූ පාර්ලිමේන්තු විවාදයක් ඉල්ලා සිටියේය. (මේ සඳහා) *http://www.ahrchk.net/statements/ Openn Letter to Honourable Speaker* වෙත

යොමුවන්න.) මෙම විවාදයේ වඩාත් අවධානයට ලක්කළ යුතු කරුණු තුනක් අදාළ ප්‍රකාශනයේ සඳහන් වේ. එම කරුණු අභියෝගයට ලක් නොකිරීම තත්ත්වය වඩාත් අයහපත් කරනු ඇත. අදාළ කරුණු වන්නේ,

අ. ශ්‍රී ලංකාවේ පොලිසියට ගනුදෙනු කිරීමට නොහැකි ආකාරයට වර්ධනය වී ඇති ගැටලුවක් වන නීතියේ ආධිපත්‍යයේ අසාමාන්‍ය බිඳ වැටීම නීතියේ ආධිපත්‍ය තුළ තබා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම.

ආ. පොලිසිය සියල්ල වැරදී ගිය පසු අදාළ ප්‍රශ්නය සම්බන්ධයෙන් හොඳින් හෝ නරකින් කටයුතු කිරීම සහ

ඇ. මහේස්ත්‍රාත්වරයා කිසිදු ප්‍රශ්න කිරීමකින් තොරව පොලිසියේ මත සාධාරණ මනුෂ්‍ය ඝාතනයක් ලෙස තීරණයකට එළැඹීම.



නීතියේ ආධිපත්‍ය පවත්වා ගැනීම සහ නීතිය නොසලකා හැරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම බොහෝමයක් දේ අතර, විශාල ලෙස ගනුදෙනු කළ යුතු ප්‍රශ්න යැයි මතයේ සිටින පිරිසකි. ඔවුන් වර්තමාන හා හිටපු පොලිස්පති, ජනමාධ්‍ය නියෝජනය කරන ඇතැම් පිරිස් සහ සමස්තයක් ලෙස ගත් විට දේශපාලන ව්‍යුහය ලෙස දැක්විය හැකිය. වර්තමාන පොලිස්පති වරයාගේ ආකල්පය පහතින් උපුටා දක්වා ඇත.

මේ වසරේ අප්‍රේල් මස පොලිස්පතිවරයා ප්‍රකාශ කළේ අපරාධ සමඟ කටයුතු කිරීමේදී පොලිසියට නීතිය අභිබවා යාමට සිදුවන බවයි.

ඔහු ප්‍රවෘත්ති සාකච්ඡාවක් අමතමින් තමන් හොඳින් හෝ නරකින් නීතිය හා සාමය පවත්වාගෙන යන බව ප්‍රකාශ කළේය. 'මේ දේවල් සිදුකරන අය පාතාලයට අයත්වීම හෝ ප්‍රසිද්ධියක් උසුලන අය වීම

අපිව අධෛර්යයට පත් කරන්නේ නැහැ. අපිත් ආයුධවලින් සන්නද්ධව ඇත. ඔවුන්ගේ ආයුධවලට බයේ අපි පසුබසින්නේ නැහැ. ඔබට අවි ආයුධ නැතිවුණාට අපිට සැලකියු යුතු ප්‍රමාණයක් අවි ආයුධ තිබෙනවා. අපේ බලකාය 77,000 සිට 80,000 දක්වා වෙනවා. අපිට ස්ථානය කුමක්ද යන්න ප්‍රශ්නයක් නෙමෙයි.'

(The Sunday Tims - 2007 මැයි 27
Cop sand Killer s", Whoreing s"
'පොලිස්කාරයින් සහ මිනීමරුවන්'
කවුද භීෂණය රජකරවන්නේ?

සියලු බරපතළ හා දරුණු අර්බුද සමග ගනුදෙනු කිරීම වගකීම ඇති පුද්ගලයින්ගේ ආකල්ප මත රැඳී ඇත. අපරාධය සමඟ ගනුදෙනු කිරීම හොඳින් හෝ නරකින් කළ යුතුය යන ආකල්පය පරාජය වෙමින් පවතී. ඒ අනුව පෙනී යන්නේ නීතිය ක්‍රියාත්මක කරන ආයතනයේ ප්‍රධානියාට උත්සන්න වන නීතිය නොතකා හැරීමේ අර්බුදය සමඟ ගනුදෙනු කිරීමේදී එවැනි ආකල්පයක් දැරිය නොහැකි බවයි.

නීතිය නොතකා හැරීමේදී හොඳින් හෝ නරකින්, නැතිනම් ආයුධ මගින් ගනුදෙනු කිරීමට සිතන නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් එම අවස්ථාවේදී ඔවුන් අයත් ආයතනයේ තාර්කික බව අතහැර දමති. තවද අපරාධය සමඟ අතාර්තික ලෙස ගනුදෙනු කිරීමට පෙළඹේ.

කිසිදු නීතිය ක්‍රියාත්මක කරන ආයතනයට අතාර්කික ලෙස කටයුතු නොහැක. 'හොඳින් හෝ නරකින් කටයුතු කිරීම යන ප්‍රකාශය' අපරාධකරුන්ගේ භාෂාවයි.

ඔවුන්ගේ ක්‍රමවේදයන්ට අනුව අපරාධකරුවන් විනාශ කිරීම මූලික අපරාධවේදයට (Crimikology) අදාළ

මූලික නීතිය හා දර්ශනය අතහැර දැමීමකි. (හොඳින් හෝ නරකින් ක්‍රියා කළ යුතුය යන ප්‍රකාශය ප්‍රකශයට පත් කිරීම උද්දච්චකමකි. එය කිසිදු ව්‍යවස්ථාපිත තනතුරක් හොබවන්නෙකුගේ අයිතියක් නොවේ.) නීතියේ ආධිපත්‍යය යන්නෙහි පදනම කිසිවෙක් නීතියට ඉහළින් නොසිටීමයි. මෙහි අර්ථයට අනුව නීතිය ක්‍රියාත්මක කරන්නෝ පවා නීතියට ඉහළින් නොසිටිති.

හමුදා නායකයින් අනුගමනය කරන ගෝත්‍රික භාවිතාවක් වන 'කල්ල' යොදවා නීතිය හා සාමය පවත්වාගෙන යාමට බාධා කරන සතුරු කල්ලි මර්දනය කිරීම හා මෙය අතර විශාල වෙනසක් ඇත. ඉහත ගෝත්‍රික රාජ්‍ය තුළ (මෙවැනි රාජ්‍ය අදත් දැකිය හැකිය.) ඒවාහි පාලකයෝ ගෝත්‍රික ක්‍රමයට පාලන කටයුතු ඉෂ්ඨ සිද්ධ කරති.) කල්ලි ක්‍රියාකාරකම්වලට සුජාතභාවය ලබාදීම දේශපාලන බලවතා විසින් එවැනි ක්‍රියාකාරකකමකට දඬුවම් පැමිණවීම මගින් සිදුවේ. කෙසේ වෙතත් නීතියේ ආධිපත්‍යය මත පදනම් වූ රාජ්‍යයක නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට කල්ලි හැසිරෙන ආකාරයට හැසිරිය නොහැක.



නීතියේ අවසර ලද පුද්ගලයින් මෙන්, පොලිසියේ ප්‍රධානීන්ට නෛතික නියෝග ලබාදීමට හිමිකමක් නැත. ඔවුන් තමන් යටතේ සිටින අය නීති විරෝධී ක්‍රියාවල නිරතවන විට එහිළා අනෙක් පුද්ගලයින් සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරයට ක්‍රියා කළ යුතුය. පොලිසිය සම්බන්ධයෙන් එක් නීතියකුත්, සෙසු සියලු දෙනා සම්බන්ධයෙන් තවත් නීතියකුත් නොමැත. සියල්ලන්ටම නීතිය එක හා සමානයි. මිනීමැරීමේ චේතනාවෙන් සිද්ධ කරන්නාවූ මිනීමැරීමක් මිනීමැරුමක්ම වේ. චේතනාව හොඳ වුවත් නරක වුවත් මිනීමැරීම මිනීමැරීමක්ම වේ. පොලිසියට

අපරාධමය ක්‍රියාකාරකම්වල නිරතවීමේ අයිතියක් නැත. යහපත් චේතනාවකින් පවා එවැන්නක් කළ නොහැක. (නිදසුනකට නීතිය සහ සාමය ආරක්ෂා කිරීමේ චේතනාව පෙරදැරිව)

මෙම සියලු කතාබහ 'හොඳින් හෝ නරකින්' කටයුතු කිරීමේ අර්බුදය සම්බන්ධවයි. එය රටේ නීතිය නොතකන වාතාවරණයට තුඩු දෙන පොලිසියේ දුර්වලතාවක් ලෙස පිළිගැනීමට අසමත් වේ. මෙම අර්බුදය අපරාධකරුවන් සංඛ්‍යාත්මකව වැඩිවීමට පමණක් අදාළ නොවේ. එහිදී පොලිසිය නමැති ආයතන විවිධ හේතූන් මත පරිහානියට පත්වීම දැක්විය හැක. මෙහිලා මේ මොහොතේ පොලිසියේ අධිකාරිය හොබවන පුද්ගලයින්ට බැණවැදීම කළ නොහැක.

වර්තමානයේ බලධාරීන්ටද චෝදනා එල්ලවිය යුතු ක්ෂේත්‍රයක් ඇත. එනම් රාජ්‍යයට ආණ්ඩුවට ඔවුන් වෘත්තිමය ලෙස කටයුතු නොකිරීම සම්බන්ධවයි. නීතිය හා සාමය පවත්වා ගැනීමෙහි ලා වෘත්තිමය ලෙස කටයුතු කිරීම අත්‍යාවශ්‍යයි. එවැනි තත්ත්වයක් ශ්‍රී ලංකාවේ පොලිසිය තුළ දක්නට නොලැබේ. ඒ වෙනුවට ඔවුහු ආණ්ඩුවේ කල්ලි බවට පත්වෙති. ආණ්ඩුවද නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට අපරාධ සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවශ්‍ය වෘත්තිය නිපුණතාව උදෙසා අවශ්‍ය සම්පත් නොසපයයි.

හොඳින් හෝ නරකින් කටයුතු කරන්නන් සම්බන්ධයෙන් පොදු වූ සත්‍යතාවක් ඇත. එසේ කටයුතු කරන්නෝ ද අපරාධකරුවන් වෙත්. අපරාධකරුවකු බවට පත්නොවී අපරාධකරුවකුගේ භූමිකාව රඟදැක්විය නොහැක. රටේ වැදගත්ම නීතිය ක්‍රියාත්මක කරන ආයතනයේ කොටසක් බවට පත්වී ඇත. නීතිය හා සාමය පවත්වා ගෙන යාමට නොහැකි වාතාවරණයක් උද්ගතවීම මෙහි ප්‍රතිඵලයකි.

පොලිස් නිලධාරියකුට අපරාධකරුවකු ලෙස කටයුතු කිරීමට ඉඩසලසහොත්, එවැනි අපරාධකරුවකු සම්බන්ධයෙන් පොලිස්පතිවරයාට ඇති සීමාව කුමක්ද? අපරාධකරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී පොලිස් නිලධාරියාද අපරාධකරුවකු ලෙස හැසිරෙන්නේ යැයි සිතමු. එම නිලධාරියා තමාගේ පෞද්ගලික අභිවෘද්ධිය තකා එසේ ක්‍රියාකළහොත් ඔහුව එයින් වළක්වාලන්නේ කෙසේද? පොලිසියේ ප්‍රධානියා 'හොඳින් හෝ නරකින් කටයුතු කිරීමේ' දර්ශනය අනුගමනය කිරීම වූ කලී ක්‍රියාත්මක කළ විට පාලනය කරගත නොහැකි ප්‍රශ්න ජනිත කරන ක්‍රියාවලියකට අවතීර්ණ වීමකි. පොලිස් නිලධාරියකු අපරාධකරුවෙක් බවට පත්වීම, ආයතනය කාලයක් තිස්සේ ආරක්ෂා කරගත් අවංකභාවය හා ඍජු බව නැති වී යාමකි. මේ හා සමානව දැඩි ලෙස අවධානයට ලක්කළ යුතු කරුණකි. එනම් පොලිසියට පමණක් ඇහුම්කන්දීමෙන් පසු මහේස්ත්‍රාත්වරයා අදාළ ඝාතන සාධාරණ මනුෂ්‍ය ඝාතන ලෙස ප්‍රකාශයට පත් කිරීමයි. මේ මගින් පොලිසිය සත්‍ය වශයෙන් ම මහේස්ත්‍රාත්වරයා ඉදිරිපිට දී වරප්‍රසාද ලත් පුද්ගලයින් බවට පත්වේ.



පුරවැසියෙක් මහේස්ත්‍රාත්වරයා ඉදිරියට ගොස් මෙසේ ප්‍රකාශ කළේ යැයි සිතමු. එනම්, තමා අදාළ පුද්ගලයා තම දේපලට ඇතුළුවීම හේතුවෙන් ආත්මාරක්ෂාව උදෙසා ඔහුව මරා දැමූ බව. මෙවැනි අවස්ථාවක මහේස්ත්‍රාත්වරයා ක්ෂණිකව එම ඝාතනය සාධාරණ මනුෂ්‍ය ඝාතනයක් ලෙස ප්‍රකාශයට පත්කරන්නේද? මෙවැනි තත්ත්වයක් ඇති වුවහොත් සෑම තැනම මිනීමැරීම් දැකගත හැකි වනු ඇත. මහේස්ත්‍රාත්වරු මිනීමරුවාගේ වචන මත රැ ‍ෙදමින් එවැනි සියලු මරාදැමීම් සාවද්‍ය මනුෂ්‍ය ඝාතන

ලෙස ප්‍රකශයට පත්කරනු ඇත. අනෙක් අතට පොලිසිය පමණක් එවැනි ප්‍රකාශ කරන විට එවැනි ප්‍රතිඵලද මීට වෙනස් විය නොහැක. ආත්මාරක්ෂාව උදෙසා මරා දමූ බවට කරන ප්‍රකාශන  දිනපතා සිදුවන දෙයක් බවට පත් වී ඇත. මෙය හොඳින් හෝ නරකින් කටයුතු කිරීමේ දර්ශනයේම පැතිකඩක් නොවන්නේද?

ඔබ අපරාධකරුවකු මරා දමන ලදැයි සිතමු. එයට කතාවක් ගෙතීම වූ කලී, හොඳින් හෝ නරකින් කටයුතු කිරීමේ දර්ශනය හා ගලපාලීමට අසීරු කරුණක් නොවේ. මහේස්ත්‍රාත්වරු සියලු මිනීමැරුම් සම්බන්ධයෙන් සම්පූර්ණ පරීක්ෂණ පවත්වතැයි ඉල්ලා නොසිටින වාතාවරණයක් සලකා බලමු. ඔවුන් අවසන් තීන්දුව ලබා දීමද නඩුව විභාග කරන අධිකරණයට පවරන විට මහේස්ත්‍රාත්වරුන්ට පවා හොඳින් හෝ නරකින් කටයුතු කිරීමේ දර්ශනයෙන් බැහැර විය නොහැක. එපමණක් නොව එය නීතියේ ආධිපත්‍යයෙන් පිට පැනීමකි.

ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍ය සම්බන්ධයෙන් උද්ගත වී ඇති අර්බුදය ගැන ආසියානු මානව හිමිකම් කොමිසම විසින් වසර 10 කට වැඩි කාලයක් තිස්සේ පෙන්වා දෙනු ලැබීය. එහි ලා ප්‍රාථමිකව බලපාන කරුණු රට තුළ දක්ෂ, නූතනයට ගැලපෙන, නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක් සංවර්ධනයට අවශ්‍ය නිසි ආයෝජනය නොකිරීම බවද පෙන්වා දුන්හ.

මෙම ආයෝජන සිදු කළ සෙසු රටවල් අපරාධ සමඟ ගනුදෙනු කරන ආකාරය වෙනස්ය. එවැනි රටවල් පුරවැසියන්ට අවුල්සහගත තත්ත්වයකට මුහුණ දිය යුතු යැයි බල කිරීමක් නොමැත. මෙම අවුල්සහගත එමෙන්ම වික්ෂිප්තව  වාතාවරණය ජනිතකරවන්නේ

අපරාධකරුවන් නැතිනම්, හොඳින් හෝ නරකින් කටයුතු කිරීමේ දර්ශනය පෙරදැරි කරගත් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ය. දේශපාලනමය අපරාධ, අපරාජිකත්වය සහ ව්‍යාකූලත්වය නිර්මාණය කරයි. මේ තත්ත්වය බලයේ සිටින පුද්ගලයින් දේශපාලන හා ආර්ථික වාසි තකා සහාය කරගනියි. ඔවුහු නීතිය ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය ආයෝජන කිරීමෙන් වැළකී සිටිති. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට අපරාධකරුවන් බවට පත් නොවී අපරාධ වැළැක්වීමට අවශ්‍ය යථාර්ථවාදී විසඳුම් සෙවීමෙහි ලා උචිත නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක් බිහිවීම මේ නිසා සිදු නොවේ. 17 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයෙන් සීමිත ආයතනික ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙනු ලැබීය. ඒ සියල්ල අතහැර දැමිණි. මේ තත්ත්වය රට තුළ නීතියේ ආධිපත්‍ය තවදුරටත් පරිහානියට පත්වීමෙහිලා දායක විය.



පොලිසිය, නීතිය නොතැකීමේ අර්බුදයට විසඳුම් සොයන්නේ නීතියේ රාමුවෙන් පිටත සිටය. ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට, සියලු පාර්ලිමේන්තු සාමාජිකයින්ට ඉටු කිරීමට කර්තව්‍යයක් ඇත. එනම් මෙම සාවද්‍ය ආකල්පය අභියෝගයට ලක් කිරීමයි. හොඳින් හෝ නරකින් කටයුතු කිරීමේ දර්ශනයට අභියෝග නොකිරීම වනාහි ශ්‍රී ලාංකික සමාජය අනතුරින් අනතුරට තල්ලු වී යාමකි. ශ්‍රී ලංකාවට නීතිය ක්‍රියාත්මක කිරීමෙහි ලා අපරාධකරුවන් අවශ්‍ය නැත. අවංකභාවයෙන් යුතු වෘත්තිමය දක්ෂ පුද්ගලයින් එයට අවශ්‍යයයි. එමගින් පමණක් නීතිය ක්‍රියාත්මක කිරීමේ නූතන යාන්ත්‍රණය නිර්මාණය කරගත හැකි වනු ඇත. ඒ සඳහා සැලකියයුතු ආයෝජනයක් කළ යුතුය.

එවැනි ක්‍රියාමාර්ගයක් නොමැතිව අන් කිසිවක් සාර්ථක නොවනු ඇත.

# පොලිස්පති නීතියට යටත්, ඊට පහළින් සිටින්නෙකි

මෑත සති කිහිපය තුළ කැළඹිලිකාර වාතාවරණයක් ශ්‍රී ලංකාව තුළ උද්ගත විය. පොලිස්පතිවරයා ප්‍රසිද්ධියේ ජාතික පොලිස් කොමිෂන් සභාවට අභියෝග කිරීමට පටන්ගෙන ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වා දුන් 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජාතික පොලිස් කොමිෂන් සභාව නිර්මාණය කෙරිණ. ශ්‍රී ලංකා පොලිසියේ පත් කිරීම, උසස්වීම් සහ විනය පාලනය පිළිබඳ බලතල පැවරී ඇත්තේ ජාතික පොලිස් කොමිෂන් සභාවටයි.



පොලිස්පතිවරයා ප්‍රසිද්ධියේ ජාතික පොලිස් කොමිසන් සභාවේ ව්‍යවස්ථානුකූලභාවය නිර්වචනය කරයි. එතැනින් නොනැවතී මාධ්‍ය හරහා ජාතික පොලිස් කොමිසන් සභාවේ ව්‍යවස්ථාපිත අධිකාරිය දෝෂාරෝපණයට ලක් කරයි. ඔහුගේ ස්ථාවරය පත්කිරීම්, මාරුකිරීම්, උසස්වීම් සහ විනය පාලනය තමන් වෙත පැවරී ඇති බවයි. ඊට අමතරව ජාතික පොලිස් කොමිෂන් සභාව වූ කලී තමන්ට නම්මවා ගත හැකි හෝ තමා යටතේ පවතින්නක් බවය. මෙම ස්ථාවරයෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පැහැදිලි ලෙස විරෝධය පෑමක් සිදුවේ.

පොලිස්පතිවරයා සිවිල් පුරවැසියෙක් පමණි. ඔහුගේ බලතල තීරණය කරන්නේද නීතිය මගිනි. එනම් අනෙකුත් සිවිල් නිලධාරීන්ගේ තත්ත්වයට සමානවය. සිවිල් නිලධාරීන්, දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් බවට පත්වීමෙන් පසුව ඔවුන් සිය බලතල ක්‍රියාත්මක කරන්නේ නීතිමය රාමුවක් තුළ සිටය.

ඔවුන් රටේ ප්‍රධාන නීතිය එනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අවනත විය යුතුය. තම බලයේ සීමාවන් මුරණ්ඩු ලෙස බැහැර කරන සහ මූලික නීතිය උල්ලංඝනය කරන්නන්, නීතිය කඩකරන අය හා සමානව නීති විරෝධීව කටයුතු කරන්නන් වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමේ කටයුත්ත හමුදාවේ ප්‍රධානීන්ට මෙන්ම පොලිසිය වෙතද පැවරී ඇත. ඔවුන්ගේ ස්ථාවරයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ ස්ථිර භරකාරත්වයක් ලෙස හැඟී යයි. භාරයේ විධායකයින්ද ඔවුන් බවට සාමාන්‍යයෙන් හැඟීයන්නකි. ඒ සමඟම ඔවුන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ නීතියට පිටින් යන බලතල නොමැත. එවැනි තනතුරක් දරන පුද්ගලයෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මුරණ්ඩු ලෙස නොසලකා හැරීම වූ කලී ඔහුව හෝ ඇයව පත්කිරීමේ මූලික අභිප්‍රායන්ටද විරුද්ධව යාමකි.

ජාතික පොලිස් කොමිෂමේ අධිකාරිය පොලිස්පතිවරයා විසින් මුරණ්ඩු ලෙස බැහැර කිරීමට බලපෑ මූලික සාධකය පොලිසියේ විනය පාලනයයි. රටේ ආයතන සංග්‍රහයට අනුව අපරාධ පිළිබඳ අධිකරණයේ චෝදනා එල්ල වී ඇති නිලධාරීන්ගේ වැඩ තහනම් කළ යුතුය. මෙම නීතියට එකඟව කටයුතු කිරීමට ජාතික පොලිස් කොමිෂන් සභාව පෙළඹිණි. මෙහි ප්‍රතිඵලය පොලිස්පතිවරයාගේ මැදිහත්වීමයි.

මේ තත්ත්වය මහජනතාවට එළිදරව් වීමට පෙර පොලිස්පතිවරයා ජාතික පොලිස් කොමිෂන් සභාවට එරෙහිව දැඩි විරෝධයක් ගොඩ නැගුවේය. මෙහිදී පොලිසියේ විනය පාලනය පිළිබඳව ඇති අධිකාරිය ප්‍රශ්න කෙරිණ. මේ අතර ශ්‍රේෂ්ඨාධිකරණය නිකුත් කළ නියෝගයක් නිසා ප්‍රශ්නය සමථයකට පත්විය. එනම් වැඩතහනමට ලක් වූ පොලිස් නිලධාරීන් විසිදෙනෙකුට වැඩි ගණනක් ඉදිරිපත් කළ මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගයට ගැනීම ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රතික්ෂේප කිරීමත් සමඟය. මෙම පොලිස් නිලධාරීන්ට අවශ්‍ය වූයේ තමන්ගේ වැඩතහනම් කිරීමේ අභියෝගයට ලක් කිරීමටයි. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් පසුවත් පොලිස්පතිවරයා විවිධ මාධ්‍ය නාලිකාවන් ඔස්සේ ජාතික පොලිස් කොමිසන් සභාවේ අධිකාරිය සම්බන්ධයෙන් තම විරෝධය පළ කිරීම දිගටම කරගෙන යන ලදි.



නීතිය ක්‍රියාත්මක කරන්නන් නීතියට ගරු නොකරන විට, අවනත නොවන විට, නීතිය ක්‍රියාත්මක කිරීම කළ නොහැක්කක් බවට පත්වේ. මෙය පොලිසියේ සමහරක් සාමාජිකයින් වෙත නීතිය නොතකා හැරීම පැතිරයාමට හේතුවකි. මෙම නීතිය නොතකන ස්වභාවය වසන් කරන අණ දෙන නිලධාරීන් රටේ නීතිය බිඳ වැටීමෙහි ලා ප්‍රධාන හේතු සාධකය වේ. ජාත්‍යන්තර යුක්ති අධිකරණයේ හිටපු සභාපති හා රටේ ඉහළ පෙළේ විනිසුරුවරයෙකු වූ සි.ජී. වීරමන්ත්‍රී, මෑතකදී මෙසේ ලිවීය.

'ශ්‍රී ලංකාවේ නීතිය හා සාමය රැකීම ඉතා පහළ මට්ටමකට ලඟා වෙමින් පවතී. සෑම ක්ෂේත්‍රයකම නීතිය හා සාමය රැකීම බිඳවැටී ඇත. රථවාහන වැරදි, පොතක සටහන් කරන ඉතා පහළ මට්ටමේ පොලිස් කොස්තාපල්වරයෙකුගේ සිට ඉහළ මට්ටමේ

නිලධාරියෙකු දක්වා අධිකාරිය අපකීර්තියට පත්ව ඇත. එපමණක් නොව නීතිය හා නෛතික ක්‍රියාදාමය බරපතළ වී ඇත. දරදඬු වී ඇත.

පොලිස්පතිවරයා, ජාතික පොලිස් කොමිෂමේ අධිකාරියට විරුද්ධ වෙයි. මෙම තත්ත්වය අධිකාරියට අපහාස කිරීම මෙන්ම නීතිය හා නෛතික ක්‍රියාදාමය බරපතළ කරන්නකි.

රට තුළ නීතියේ ආධිපත්‍ය දියණු කිරීමට, ස්ථාවරත්වයට හා මානව හිමිකම් සඳහා ජාතික පොලිස් කොමිසමේ අධිකාරියට ගරු කළ යුතු බව අපි දැඩිව අවධාරණය කර සිටිමු.





ඝාතනය කරන ලද ළමුන් දෙදෙනා

# ශ්‍රී ලංකාවේ ප්‍රමාණවත් අපරාධ විමර්ශකවරුන් නොමැත, කුමක් කරමුද?

2004 සැප්තැම්බර් මස දිනක බ්‍රිතාන්‍ය ගුවන් විදුලි සේවයේ සංදේශය වැඩසටහනකට හිටපු සොලිසිටර් ජනරාල් එනම් වර්තමාන නීතිපතිවරයා කළ ප්‍රකාශකයකින් පහත කරුණු උපුටා ගනු ලැබේ. එනම් ශ්‍රී ලංකාවේ අපරාධ විමර්ශනය වැළැක්වීමෙහි ලා පළපුරුදු විමර්ශකවරුන් නොමැතිවීම බලපාන බවයි. හිටපු සොලිසිටර්වරයා පැවසූ දෙය බොහෝ කාලයක සිට නිරන්තරයෙන් පොලිස් සේවයද ඇතුළත් ආණ්ඩුවේ ආයතන විසින් ප්‍රකාශ කරනු ලැබේ. පොලිසිය තුළ ප්‍රමාණවත් පළපුරුදු අපරාධ විමර්ශකවරුන් නොමැත. මේ කරුණ සම්බන්ධයෙන් සියලු නිලධාරීන්, දේශපාලන නායකයින් සහ මහජනතාව අතර පොදු එකඟතාවයක් පවතී.

අවසානයේදී ඇසිය යුතු වඩාත් වැදගත්ම ප්‍රශ්නය කුමක් කළ යුතුද? යන්නයි. කෙසේ නමුත් මෙය කිසිවෙක් අසන්නේ නැත. මෙය ප්‍රශ්නය සම්බන්ධයෙන් කෙරෙන්නා වූ ප්‍රකාශනයක් පමණි. එය විශ්ලේෂණය කිරීමට හෝ විසඳුම් සෙවීමෙහි ලා ඒ හා සමාන ප්‍රයත්නයක් ගනු නොලැබේ.

ප්‍රශ්නයට ඇත්තේ සරල පිළිතුරකි. එනම් සුදුසුකම් ඇති අපරාධ විමර්ශකවරුන් ප්‍රමාණය වැඩි කිරීමයි. මෙයින් තොර වෙනත් ප්‍රබුද්ධ විසඳුමක් නොමැත.

මේ සමඟ පැන නගින්නා වූ තවත් ගැටලුවකි. සුදුසුකම් ඇති විමර්ශකවරුන්ගේ සංඛ්‍යාව කෙසේ වැඩි කරන්නේද යන්නයි. මේ සඳහා සුදුසුකම් ඇති අය අතරින් හොඳ අය තෝරා අමතර පුහුණුවක් ලබාදිය යුතුය. නැතිනම් වඩාත් සුදුසුකම් ඇති අය අලුතින් බඳවා ගත යුතුය. සමහර විට මෙම අදහස් දෙකම සලකා බැලීමට සිදුවේ. ඉහළ පුහුණුවකට සුදුසු යහපත් සුදුසුකම් ඇති පුද්ගලයින් සිටින්නේ නම් ඔවුන්ට මෙම පුහුණුව ලබාදීම වැදගත් වේ. එවැනි පුද්ගලයින් ප්‍රමාණවත් නොවේ නම් පිටත සිටින පුද්ගලයින් අනුයුක්ත කර ගත යුතුයි. ඔවුන්ට ඉහළ මට්ටමේ පුහුණුවක්ද ලබාදිය යුතුයි. ඊළඟට තවත් ප්‍රශ්නයක් පැන නගී. මෙම තීරණය ගැනීමේ වගකීම කා සතුද? ආණ්ඩුව සතුයි. අවශ්‍ය පරිදි කටයුතු කර සුදුසුකම් ඇති විමර්ශකවරුන් බඳවා ගැනීමේ තීරණය ආණ්ඩුව විසින් ගත යුතුය. මේ කරුණ සම්බන්ධයෙන් ආණ්ඩුව තීරණයක් නොගන්නා විට ප්‍රමාණවත් සම්පත් ලබා නොදෙන විට නොවැළැක්විය හැකි දෙයක් සිදුවේ. එනම් ශ්‍රී ලංකාව තුළ ප්‍රමාණවත් තරම් සුදුසුකම් ඇති අපරාධ විමර්ශකවරුන් නොමැති බවට කෙරෙන්නා වූ අඳෝනාව යළි යළිත් පුනරාවර්තනය වීමයි. සෑම වේලාවකම සිදුවන අපරාධ සංඛ්‍යාව ඉහළ යයි. සෑම වේලාවකම පොලිස් ස්ථාන තුළ සිදුවන වධහිංසා පැමිණවීම පිළිබඳ වාර්තාවීම් ඉහළ යයි. 'අපට ප්‍රමාණවත් තරම් සුදුසුකම් ඇති අපරාධ විමර්ශකවරුන් නොමැත' යන ප්‍රකාශය පුන පුනා

කියවනු ලැබේ. මෙයින් ගැලවීමට ඇත්තේ එක් ක්‍රමයකි. ආණ්ඩුව අර්බුදය විසඳීමෙහි ලා තීරණයක් ගත යුතුය. එහිලා අවශ්‍ය සම්පත් ලබාදිය යුතුය. අපරාධ නිසි පරිදි විමර්ශනය කිරීමට පොලිසියට පවත්නා නොහැකියාවට පමණක් ශ්‍රී ලංකාවේ මහජන මතය සීමා වී ඇත. එම කරුණු අභිබවා යාමට මහජන මතය අපොහොසත් වී ඇත. රටේ අපරාධ විමර්ශකවරුන්ගේ තත්ත්වය වැඩි දියුණු කිරීමට ආණ්ඩුව අවශ්‍ය තීරණයන්ට නොඑළඹීම සහ අපරාධ ශ්‍රී ලංකාවට ප්‍රමාණවත් සුදුසුකම් ඇති අපරාධ විමර්ශකවරුන් නොමැතිව බව කියවේ. මෙයට හේතුව ආණ්ඩුව ඔවුන් ලබා ගැනීමට තීරණය කර නොතැබීමයි. අපරාධ ශීඝ්‍රයෙන් වැඩිවීම සහ පුළුල්ව පැතිර යන වධහිංසා පැමිණවීම් වූ කලී ආණ්ඩුව තුළ පවත්නා නොහැකියාවේ ප්‍රතිඵලයන්ය. මෙම තර්කයෙන් ගැලවී යා නොහැක. අපරාධ වැඩිවීමට සහ පොලිස් ස්ථානවල සිදුවන වධහිංසා පැමිණවීම්වලට ආණ්ඩුවේ පවත්නා නොහැකියාව වගකිව යුතුය. ශ්‍රී ලංකාවේ සුදුසුකම් ඇති අපරාධ විමර්ශකවරුන් අවශ්‍ය වේ. මේ තත්ත්වය වැළැක්වීමෙහිලා ආණ්ඩුවේ නොහැකියාව බලපායි.

මෙම නොහැකියාවෙන් ආණ්ඩුව ගලවා ගැනීමට හැක්කේ කවරෙකුටද? යන්න ඊළඟට මතුවන ප්‍රශ්නයයි. එහි ආරම්භය මහජන මතයයි. මාධ්‍ය සහ සිවිල් සමාජයේ සංවිධාන සුදුසුකම් ඇති අපරාධ විමර්ශකවරුන් ඉල්ලා සිටිය යුතුයි. එවිට තවදුරටත් ආණ්ඩුවට තම නොහැකියාව පවත්වා ගෙන යා නොහැක. මේ සම්බන්ධයෙන් මහජන මතය බිඳ වැටී ඇත. අපරාධ වැඩිවීම පිළිබඳව සහ පොලිස් වධහිංසා පැමිණවීම අතර සම්බන්ධතාවයක් ඇත. මහජන මතය තුළ මේ කරුණ ප්‍රකාශයට පත් නොවේ.

අපරාධ වැඩිවීම් සහ පොලිස් ස්ථානවලට ආවේණික වී ඇති වධහිංසා පැමිණවීම් පිළිබඳ වගකීම මහජන මතය විසින් නිසි ලෙස ස්ථානගත කරන්නේ යැයි සිතමු. එවිට ආණ්ඩුව එක පයින්ම අඥෝනා කීමෙන් වැළකී යම් පියවරක් ගැනීමට තීරණය කරනු ඇත. එපමණක් නොව රටේ සියලු දෙනාට බලපාන කරුණු සම්බන්ධයෙන් සැබෑ විසඳුමක් සෙවීමෙහි ලා සිත් ගන්නා සුළු තීරණ ගැනීමෙහිලා ද, ඔවුන් පෙළඹෙන බව කිව යුතුය.





භූමි දානයට පෙර...

# මානව හිමිකම් සුරැකීම සඳහා ශ්‍රී ලංකාවේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය තුළ පවත්නා මූලිකාංග ප්‍රතිසංස්කරණය අත්‍යාවශ්‍යයි.

**ජාත්‍යන්තර වගකීම**

(අ) i. ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අයත් වෛකල්පික ප්‍රොටොකෝලයේ වගකීම් ඉටුකිරීමෙහි ලා ආණ්ඩුව පහත සඳහන් ක්‍රියාමාර්ග ගත යුතුයි. ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් කමිටුවේ අදහස් හා යෝජනා ක්‍රියාවට නැඟීම සඳහා ආණ්ඩුව වහා ව්‍යවස්ථාපිත පනතක් සම්මත කළ යුතුය. එවැනි පනතක් සම්මත කිරීම සින්හරාසා නඩුවෙන් පසුව වඩාත් හදිසි අවශ්‍යතාවක් වී ඇත. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙන් තමන්ට හිමි අයිතිවාසිකම් උල්ලංඝනය වූ අවස්ථාවක ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුට මානව හිමිකම් කමිටුවට පැමිණිලි කිරීමේ හැකියාව ලැබිණි. මෙම නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය, මානව හිමිකම් කමිටුවේ තීරණය සම්බන්ධයෙන් දුන් තීන්දුව

නිසා මෙම අයිතිවාසිකම් අහිමිවීමක් සිදුවේ. එම නිසා වහාම ව්‍යාවස්ථාපිත පනතක් සම්මත කිරීම අවශ්‍ය වේ.

ii. ගිවිසුම්ගත ආයතන ආණ්ඩුවට නිර්දේශ ඉදිරිපත් කරයි. මෙසේ නිර්දේශ ඉදිරිපත් කළ වහාම ඒ පිළිබඳව කටයුතු කිරීමට පාර්ලිමේන්තු අනුකාරක සභාවක් පත්කළ යුතුය. මානව හිමිකම් කමිටුව වාර්ෂික වාර්තා පරීක්ෂා කිරීමෙන් පසුව නිර්දේශ නිකුත් කරයි. වධහිංසාවට එරෙහි කමිටුව (CAT Committee) කාන්තාවට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් පිටුදැකීමේ කමිටුව (CEDAW) සහ අනෙකුත් කමිටු මේ වන විටත් නිර්දේශ රැසක් ඉදිරිපත් කර ඇත. මෙම සියලු නිර්දේශ පාර්ලිමේන්තු අනුකාරක සභාවට යොමු කළ යුතුය. මෙවැනි නිර්දේශවලට රජයේ ප්‍රතිචාරය පරීක්ෂා කිරීමට අවශ්‍ය වරම පාර්ලිමේන්තු අනුකාරක සභාව විසින් රාජ්‍ය එවැනි නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙහි ලා ගනු ලැබූ මිනුම්දඬු සියල්ල පරීක්ෂා කිරීම අවශ්‍ය කෙරේ.



## විමර්ශන

ආ. i. සියලු මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ විමර්ශන පැවැත්වීමේ වගකීම පොලිස් දෙපාර්තමේන්තුව හරහා පොලිස්පතිවරයා වෙත පැවරේ. පහළ නිලධාරීන් සිදුකරන වධහිංසා පැමිණිවීම් සමහරක් හැරුණු විට ශ්‍රී ලංකාවේ අපරාධ නඩු විධාන සංග්‍රහයට අනුව මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳව විමර්ශන පැවැත්වීමට පොලිසියට නොහැකි වී ඇත. මෙම අසමර්තය මගින් ශ්‍රී ලංකාවේ අපරාධ විමර්ශන ක්‍රියාදාමය තුළ පවත්නා

අසංවිධානාත්මක බව මැනවින් පිළිබිඹු කරයි. 1940 ගණන්වල සිට විවිධ කොමිෂන් සභා මේ කරුණ සම්බන්ධයෙන් කටයුතු කිරීමට පත් කෙරිණි. ඒ සියල්ල මෙම අසමර්ථ හෙවත් නොහැකියාව හඳුනා ගනු ලැබීය. කෙසේ නමුත් මෑත දශක කිහිපය තුළ තත්ත්වය යහපත් වීම වෙනුවට වඩාත් නරක අතට හැරිණ. මෙම අනුග්‍රහය යටතේ සිදුවන ප්‍රචණ්ඩත්වයයි. එනම් පැහැර ගැනීම්, අතුරුදහන්වීම්, වධහිංසා පැමිණවීම්, සමූහ මිනීවලවල් නිර්මාණය කිරීමේ සිට රැඳවුම් ස්ථානවල වධකාගාර පවත්වා ගෙන යාම දක්වා (විශේෂයෙන් හමුදාව පවත්වාගෙන යනු ලබන රැඳවුම් ස්ථානවලට) විවිධ අයුරින් මෙම ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක වේ. රාජ්‍ය අනුග්‍රහය යටතේ සිදුකරනු ලබන ප්‍රචණ්ඩත්වය දෙයාකාරයක අර්බුද නිර්මාණය කරයි. එකක් ඉහළ නිලධාරීන්ද ඇතුළත් පොලිස් නිලධාරීන් විසින්ම මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියාවල මහා පරිමාණයෙන් නිරත වීමයි. අනෙක් හේතුව රාජ්‍ය විසින්ම මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියා සිදුකිරීමට සහභාගි වීමයි. රාජ්‍ය සහභාගිත්වය නිසා අදාළ ක්‍රියා විමර්ශනය කිරීම දැඩි ලෙස සීමා වෙයි. විමර්ශන ඒකකය තුළ පවත්නා මෙම අර්බුදය අපරාධකරුවන්ට දඬුවම් නොලැබ නිදහසේ සිටීමේ වාතාවරණයට බල පත්‍රයක් සපයයි. මෙම කරුණ සාකච්ඡාවට ගත යුතුය. එසේ කළහොත් පමණක් සියල්ලේ දියුණුවක් දැක ගත හැකිවේ.

**සටහන්:** - මෙම අර්බුදය මඟහැරවීමෙහිලා සියලු ආකාරයේ ප්‍රයත්නයන් ගනු ලැබේ. එවැනි එක් අවස්ථාවක් ලෙස මානව හිමිකම් කොමිසමට හෝ පත්කරනු ලබන විවිධ

කොමිසම්වලට මානව හිමිකම් විමර්ශනය පැවරීම දැක්විය හැකිය. මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ තොරතුරු සෙවීමට හෝ අධීක්ෂණයමය ක්‍රියාවන් උදෙසා මෙම කොමිසන් සභා පත් කෙරේ. එක් කොමිසමකට සිය කටයුතු නිරීක්ෂණය කිරීමෙහිලා ජාත්‍යන්තර විශේෂඥවරුන් සපයා දී ඇත. ශ්‍රී ලංකාවේ පොලිසියට අපරාධ විමර්ශන කටයුතු කිරීමෙහිලා අවශ්‍ය බලය නීතිය මගින් පැවරී ඇත. මෙම අපරාධ විමර්ශන කටයුතුවල ප්‍රතිසංස්කරණ උදෙසා ආදේශකයක් ලෙස මෙවැනි කොමිසන් සභා අනුචිත බව ආසියානු මානව හිමිකම් කොමිසමේ විශ්වාසයයි. මෙවැනි ආකාරයේ ප්‍රයත්නයන් මානව හිමිකම් උල්ලංඝනයන් සඳහා, විශ්වාසනීය විමර්ශනය පැවැත්වීම අරමුණු කරගෙන සිදුවේ. එහෙත් මේ සියල්ලෙන් එවැන්නක් ඉටු කර ගත නොහැකි බව ආසියානු මානව හිමිකම් කොමිසම දිගින් දිගටම ප්‍රකාශ කරයි. චේතනාන්විතව හෝ වෙනත් ආකාරයෙන් ගනු ලබන මෙවැනි මිනුම්දඬු විමර්ශන පැවැත්වීම ප්‍රමාද  කරනු ලැබේ. ඒ හේතුවෙන් පැමිණිකරුවන් තම පැමිණිලි සම්බන්ධයෙන් ලුහුබැඳයාම අපතේ යෑමක් බවට පත්වේ. මෙවැනි සිද්ධීන්වලදී බොහෝ කාලයක් තිස්සේ මහජනතාව විසින් කරනු ලැබූ බලපෑම්ද අපතේ යයි. අවසානයේදී ප්‍රශ්නය සැබෑ තත්ත්වයට පත්වේ. එනම් මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් විමර්ශන නොපැවැත්වීමය. මේ කරුණ ආණ්ඩුවට මෙන්ම දේශීය මානව හිමිකම් කණ්ඩායම්වලට සහ ජාත්‍යන්තර මානව හිමිකම් කණ්ඩායම්වලට අවබෝධ කර දීමට ආසියානු මානව හිමිකම් කොමිසම දැඩි වෙහෙසක් ගත්තේය. එපමණක් නොව මානව හිමිකම්

උල්ලංඝනයන් පිළිබඳව කටයුතු කිරීමේදී මෙම කරුණු තීරණාත්මක වන බව පෙන්වා දුන්නේය. මෙම මූලික කරුණුවලට ආණ්ඩුව, දේශීය මානව හිමිකම් කණ්ඩායම් මෙන්ම ජාත්‍යන්තර මානව හිමිකම් කණ්ඩායම් ප්‍රමාණවත් අවධානයක් යොමු කළේ නැත. මේ නිසා ආසියානු මානව හිමිකම් කොමිසම බලවත් ලෙස කණස්සල්ලට පත්විය. ආසියානු මානව හිමිකම් කොමිසමේ මානව හිමිකම් කණ්ඩායම් මේ කරුණ කේන්ද්‍රීය කරුණ ලෙස සැලකිය යුතු බවයි.

**එසේ නොවුණහොත් ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් පිළිබඳ සහන සැලසීම කිසිදු දියුණුවක් අත්කර ගැනීමට අපොහොසත් වනු ඇත. එපමණක් නොව තත්ත්වය තවදුරටත් නරක අතට හැරෙනු ඇත.**



ii. ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා ශ්‍රී ලංකාවේ පොලිසිය තුළ පවතින පහත සඳහන් ගැටලු සාකච්ඡාවට ගැනීම අවශ්‍ය වේ.

iii. ඉහළ නිලධාරීන් පහළ නිලධාරීන්ගේ කටයුතු සම්බන්ධයෙන් වගකියන්නේ නැත. මෙම වගකීම පොලිසිය සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අවශ්‍ය බව ආයතන සංග්‍රහයේ දක්වා ඇත. මේ තත්ත්වය සාමාන්‍ය කටයුතුවලදී සෑම පොලිසියක් තුළම භාවිතා විය යුතු අතර එය අපරාධ විමර්ශනය විශ්වාසනීය ලෙස සිදුවීමෙහිලා අවශ්‍ය වේ. පොලිසියේ ඉහළ ශ්‍රේණිවල ගුණාත්මකභාවය සහ ඉහළ නිලධාරීන් තම වගකීම් ඉටු කිරීමට දක්වන ලැදියාව අතර බරපතළ අර්බුදයක් පවතී. ඉහළ නිලධාරීන් තම වගකීම් ඉටු කිරීම පැහැර හරිති.

මේ තත්ත්වය සමහරක් පොලිසියේ ඉහළ නිලධාරීන්ට බරපතළ දූෂණ චෝදනා එල්ලවීමෙහි ලා බලපායි. පොලිසිය තුළ ඉහළ තනතුරුවල පවත්නා අර්බුද විසඳිය යුතුය. එසේ නොමැතිව නීතියට අනුකූලව කටයුතු කිරීමක් පොලිසිය තුළ සිදු නොවනු ඇත. පොලිසියේ ඉහළ ශ්‍රේණිවල පවත්නා අර්බුද පහළ ශ්‍රේණි වලටද සෙමින් පැතිර යයි. මෙහි ප්‍රතිඵලය අද දවසේ සමස්ත ක්‍රියාදාමය විෂමතාවයකට භාජනය වීමයි. අක්‍රීය වීමයි. ආසියානු මානව හිමිකම් කොමිසම අඛණ්ඩව මෙම කරුණ ඉස්මතු කොට දක්විය. ආසියානු මානව හිමිකම් කොමිසම තවදුරටත් කණස්සල්ලට පත්වන කරුණක් ඇත. එනම් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව, දේශීය මානව හිමිකම් කණ්ඩායම් පමණක් නොව ජාත්‍යන්තර මානව හිමිකම් කණ්ඩායම්, මානව හිමිකම් උල්ලංඝනයන් සමඟ ගනුදෙනු කිරීමේදී මෙයට ප්‍රමාණවත් වැදගත්කමක් ලබා නොදීමයි.



iv. ඉහත සඳහන් අර්බුදයන්හි ප්‍රතිඵල පහත පරිදිය.

පොලිසිය තුළ සිටින බරපතළ අපරාධ පිළිබඳ විමර්ශකවරුන්ට අභ්‍යන්තරයෙන් සහයෝගයක් නොලැබේ. බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන්ද ඇතුළත් බරපතළ අපරාධවලදී විමර්ශන පැවැත්වීමෙහි ලා ඔවුන්ට ආරක්ෂාවද නොලැබේ. මෙවැනි විමර්ශකවරුන්ගේ ජීවිත අනතුරට ලක්වී ඇත. මෙවැනි අනතුරු බාහිර පාර්ශ්වයන්ගෙන් එනම්, ත්‍රස්තවාදය පිළිබඳ චෝදනා ලැබූ සංවිධානාත්මක අපරාධ සිදුකරන බලවේගයන්ගෙන් එල්ල වේ. ඔවුන් ඔවුන්ගේම සංවිධානය තුළ පාවාදීම සම්බන්ධ අර්බුදයන්ට මුහුණ දෙයි. මෙහි ප්‍රතිඵලය රටේ ප්‍රධාන නීතිය ක්‍රියාත්මක කරන ආයතන තුළ අපරාධ විමර්ශන

පැවැත්වීමේ හැකියාව නිර්මාණය කිරීමට ලබා දුන් සියලු නිපුනතා සහ පුහුණුව අපතේ යැමයි. ආසියානු මානව හිමිකම් කොමිසම නැවත වරක් කරන සඳහනක් ඇත. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව, දේශීය හෝ ජාත්‍යන්තර මානව හිමිකම් කණ්ඩායම්, මෙම ගැටලුව සම්බන්ධයෙන් සැලකියු යුතු අවධානයක් ලබා දී නැත.

v. ජාතික පොලිස් කොමිසම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ක්‍රියාදාමයට අනුකූලව පත්කළ කොමසාරිස්වරුන් මාර්ගයෙන් ක්‍රියාත්මක වූ කාල වකවානුවක් තිබිණි. එම අවස්ථාවේ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් තුළ තමන්ට ආරක්ෂාව පවතින බවට හැඟීමක් නිර්මාණය විය. එනම් තම ඉහළ නිලධාරීන්ගෙන් එල්ලවන බලපෑම්වලින් මෙන්ම දේශපාලන මැදිහත්වීම් සම්බන්ධයෙන් අවශ්‍ය ආරක්ෂාව සැලසීමේ හැකියාව ජාතික පොලිස් කොමිසමට තිබිණි. දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත්කිරීම් සිදුකර නැත. ඒ හේතුවෙන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ාවට අනුකූලව කටයුතු සිදුකෙරෙන්නේ නැත. ප්‍රතිඵලය ජාතික පොලිස් කොමිසමට දේශපාලන පත්කිරීම් සිදු කිරීමය. මීට පෙර සිටි කොමසාරිස්වරු තම ධූර කාලය තුළ යම්තාක් දුරකට සදාචාරාත්මක අධිකාරියක් ගොඩනැඟීමට සමත් විය. එහෙත් මෙය සදාචාරාත්මක අධිකාරියක් ගොඩනැඟීමට සමත් විය. එහෙත් මෙම සදාචාරාත්මක අධිකාරිය වර්තමානයේ විනාශයට පත් වී ඇත. දැන් පොලිස් නිලධාරීන් තම ආරක්ෂාව සම්බන්ධයෙන් ජාතික පොලිස්

කොමිසමේ පිහිට අපේක්ෂා නොකරති. ඔවුන් 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වීම යළි පනගැන්විය යුතුය. එය රටේ ප්‍රධාන ආයතනවල ආයතනික මට්ටමේ ස්වාධීනතාවය බේරා ගැනීමට අවශ්‍ය ක්‍රියාදාමයේ පූර්ව කොන්දේසියකි.

## නිතිපතිවරයා

1. බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන්ද ඇතුළත් බරපතළ අපරාධ සම්බන්ධයෙන් නඩු පැවරීමට අසමත් වී ඇත. මෙම අසමර්ථය නීතිපතිවරයා යටතේ නීතිපති දෙපාර්තමේන්තුවේ පවත්නා නොහැකියාවේ කොටසකි. අසමර්ථය හා ඒ සම්බන්ධ විසඳුමක් පිළිබඳව සැලකිලිමත් වීමක් ආණ්ඩුවෙන් හෝ දේශීය සහ ජාත්‍යන්තර මානව හිමිකම් කණ්ඩායම්වලින් දක්නට නොලැබේ. නීතිපති දෙපාර්ථමේන්තුව මෙහිලා සමාවට ද කරුණු කියයි. එනම්, පොලිසියේ විමර්ශකවරුන් ප්‍රමාණවත් පරිදි සාක්ෂි ලබා දුනහොත් පමණක් තමන් නඩු පවරන බවය. එය තවදුරටත් සඳහන් කරන්නේ විමර්ශන සහතික කිරීමේ වගකීම තමන් වෙත නොපැවරෙන බවය. ඉහත කරුණු හේතුවෙන් විමර්ශන පැවැත්වීමක් සිදු නොවේ. එවිට නීතිපති දෙපර්තමේන්තුව සඳහන් කරන්නේ මෙම වාතාවරණයට නඩු පවරන්නන් වග නොකියන බවය.

නීතිපතිවරයාට පහත කරුණු සම්බන්ධයෙන් නොසලකා හැරීමක් සිදුකළ නොහැකි බවට අදාළ ව්‍යවස්ථාවෙන් සහතිකයක් ලබා දිය යුතුය. එනම්

මානව හිමිකම් ද ඇතුළත් බරපතළ අපරාධ සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති විට පවා නොසලකා හැරිය නොහැක. එවැනි අපරාධ සම්බන්ධයෙන් සිදුකෙරෙන්නා වූ විමර්ෂණවල ප්‍රගතිය පිළිබඳව ආණ්ඩුව හා මහජනතාව දැනුවත් කළ යුතුය.

මීට අමතරව පහත කරුණුද ව්‍යවස්ථාවෙන් සහතික කළ යුතුය. අපරාධ විමර්ශන පැවැත්වීමේදී පොලිසියට ලබා දී ඇති නියමිත කාලය බිඳ දැමීමට මෙන්ම වර්තමානයේ නීතිපති දෙපාර්තමේන්තුව තුළ පවත්නා සිය වගකීම් නොසලකා හැරීමේ වාතාවරණය.

ii. ඉහත ජේදයේ දක්වා ඇති යෝජනාවලට පහත විකල්පයද යෝජනා කෙරේ. එනම් ස්වාධීනව මහජනතාව සම්බන්ධයෙන් නඩු පවරන කාර්යාලයක් නිර්මාණය කිරීමයි. පැහැදිලිව දක්වා ඇති සියලු බරපතළ අපරාධ සම්බන්ධයෙන් නඩු පැවරීමේ බලය එයට ලබාදිය යුතුය.

එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නඩු පැවරීම සම්බන්ධයෙන් ස්වාධීනතාව හිමිවේ. ප්‍රධානියා පිළිබඳ පාලනයක් නීතිපතිවරයා ඇතුළු කිසිදු ආයතනයක් වෙත නොපැවරේ. නීතිපතිවරයාගේ දෙපාර්තමේන්තුව යටතේ පවතින දෙපාර්ථමේන්තුවක් වීමෙන් එය බැහැර විය යුතුය. එනම් 1973 මොඩලයට අනුව සුදුසු සංශෝධන සහිත මහජනතාව වෙනුවෙන් නඩු පවරන්නෙකු මෙයින් බලාපොරොත්තු වේ. එවැනි ආයතනයකට තම වගකීම් ඉටු කිරීමෙහි ලා මානව හා භෞතික සම්පත් අවශ්‍ය වේ.

iii. මීට ඉහත ඇති ඡේද දෙක මගින් විකල්ප දෙකක් යෝජනා කෙරිණි. එමගින් නඩු පැවරීමේ කර්තව්‍යය හා විමර්ශන පැවැත්වීමේ කටයුතු එකට එකතු කිරීමක් බලාපොරොත්තු නොවේ. රටේ මහා පරිමාණයේ මානව හිමිකම් උල්ලංඝනය වේ. සංවිධානාත්මක අපරාධවල ස්වාභාවයද නොසලකා හැරිය නොහැක. මේ කරුණු සලකා බැලීමේදී කර්තව්‍යයන් දෙකම එකම සංවිධානයකට ලබාදෙන්නා වූ ආයතනයක් නිර්මාණය කිරීම කළ නොහැක්කකි. නඩු පවරන ආයතනය, විමර්ශන පවත්වන ආයතනය සමඟ සමීපව කටයුතු කිරීම පමණක් යෝජනා කෙරේ. ඒවාට නීතියේ පැහැදිලිව දක්වා ඇති අධීක්ෂණය සම්බන්ධ වගකීම් ඇත.

(ඈ. 4) (ඈ. 1) හා (ඈ. 2) පරිච්ඡේදවල සඳහන් යෝජනා දෙකෙන් වඩාත්ම ක්‍රියාකිරීම සඳහා කළ යෝජනාව සංක්‍රාන්ති කාල පරිච්ඡේදය සම්බන්ධයෙනි. එය ඈ. 1 ජේදයේ දක්වා ඇත. එනම් නීතිපතිවරයාට නඩු පැවරීම සම්බන්ධයෙන් ව්‍යවස්ථාවක් පැනවිය යුතුය. එහි මේ ක්ෂේත්‍රයේදී නීතිපතිවරයා සතු වගකීම් පැහැදිලිව සඳහන් කළ යුතු වේ.

ඈ. 1. විමර්ශන ක්‍රියාදාමය සහ නඩු පැවරීම තුළ පවත්නා අතවරයන් වළක්වා සාධාරණ නඩු විභාගයක් සහතික කිරීම අධිකරණ භූමිකාවයි. මෙය වූ කලී අපරාධ යුක්තිය පසිඳලීම බැඳ වැටී ඇති වත්මන් වාතාවරණය තුළ වැඩිපුරම අවධානය යොමු විය යුතු ක්ෂේත්‍රයකි. එක්තරා දුරකට අධිකරණ භූමිකාව සමඟ ගනුදෙනු කිරීමේ නීතිය සහ අධිකරණ තීන්දු

සම්බන්ධයෙන් ප්‍රතිපාදන ඇත. කෙසේ වෙතත් මෙම භූමිකාව පැහැදිලිව ප්‍රකාශයට පත් නොවේ. එය ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළ බෙස්ට් බෙකරි නඩුව වැනිය. (Best Bakery Case. මේ සඳහා Zahira Habibulla H Sheikh and anr petitioner) Vs. State of Gujarat and Ors (Respdent) CASE No. Appeal (crl) 446-449 of 2004 decided on 12/04/2004 බලන්න.) මෙම නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය නඩුවක් විභාගයට ගන්නා අධිකරණයේ වගකීම ඉතා තදින් ප්‍රකාශයට පත් කළේය. මේ ප්‍රකාශයේදී සඳහන් කළ කරුනු අතර ඕනෑවට එපාවට කටයුතු කිරීම සහ අපක්ෂපාති විමර්ශන නොපැවැත්වීම, මහජනතාවගේ නඩු පවරන්නා නඩු අවිධිමත් ආකාරයට පවත්වා ගෙන යාම සහ සාක්සිකරුවන්ට ආරක්ෂාව සැලසීමේලා රජයේ නොහැකියාව ඒ අතර වේ.



ඉහත සියලු දේ රජය වෙත පැවරෙන අතර, සාධාරණ නඩු විභාගයක් සහතික කිරීමේ වගකීමද රජය සතු වේ. ඉතා දීර්ඝ නඩු තීන්දුවක් ලබාදුන් අධිකරණය නඩු විභාග කරන විනිසුරුවරයෙකුගේ යුතුකම් සවිස්තරාත්මකව පැහැදිලි කරන ලදී. විනිසුරු හුදුවාර්තා කරන්නෙකු හෝ පසුගාමී නිරීක්ෂකයකු පමණක් නොවිය යුතුය. අපරාධ නඩුවලදී සාධාරණ නඩු විභාගයක් සහතික කිරීමට ක්‍රියාකාරී ලෙස තම භූමිකාවේ නිරත වීම අවශ්‍ය වේ. ගුජරාටයේ සිදු වූ මනුෂ්‍ය ඝාතන දක්විය හැකිය. එහිදී සංවිධානාත්මක වූ හින්දුන්ගෙන් සමන්විත කල්ලි මුස්ලිම්වරු ඝාතනය කළහ. මේ කරුණු නීතියේ ආධිපත්‍ය පවත්වා ගැනීමට සහ නීතිය පිළිබඳ මහජන විශ්වාසය යළි ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් වඩාත් වැදගත් වේ. ශ්‍රී ලංකාවේ

වත්මන් වාතාවරණය තුළ මෙම වගකීම් අධිකරණමය තීරණයක් මගින් පැහැදිලි කළ යුතුව ඇත. එනම් අපරාධ නඩු විධාන නීතිය දියුණු කිරීමෙහිලා ව්‍යවස්ථාවක් පැනවීම සිදුකළ යුතුය. එමගින් නඩුව විභාග කරන අධිකරණය සතු වගකීම් වඩාත් හොඳින් වඩාත් හොඳින් පැහැදිලි කිරීම අවශ්‍ය වේ. එනම් විධිමත් ලෙස විමර්ශන පැවැත්වීම සහ අපරාධ සම්බන්ධයෙන් නඩු පැවරීම්වලදී පවතින සමහරක් ගැටලුකාරී තත්ත්වයන් විසඳීමෙහිලා එය සුවිශාල දායකත්වයක් සපයනු ඇත.

ii. මෑතකදී සිදු වූ අධිකරණ ක්‍රියාදාමයකින් තොරව සිදුකරන මනුෂ්‍ය ඝාතනයන් නිරීක්ෂණය කළ යුතුය. මෙවැනි අවස්ථාවල පොලිසිය හෝ හමුදාව ප්‍රකාශ කරන්නේ සැකකරුවන් පැන යාමට තැත් කරද්දී මරණය සිදු වූ බවයි. මහේස්ත්‍රාත්වරයාද පශ්චාත් මරණ පරීක්ෂණයේ මුල් අදියරවලදීම සිද්ධිය සම්බන්ධයෙන් තීරණයන්ට එළැඹේ. සැකකටයුතු මරණ සම්බන්ධයෙන් ක්‍රියාකරන මහේස්ත්‍රාත්වරුන්ට පැහැදිලි උපදෙස් ලබාදිය යුතුය. මෙහිදී නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සිදු කළ බවට කියන මරණ සම්බන්ධයෙන් වඩා වැඩි විශේෂත්වයක් හිමි විය යුතුය. සාවද්‍යතාව පිළිබඳ තීරණයකට එළඹීම නඩු විභාග කරන අධිකරණයට ඇත. එ සම්බන්ධයෙන් සියලු පැහැදිලි උපදෙස් ලබාදිය යුතු අතර, තීරණවලට එළඹිය යුත්තේ පවත්නා සියලු සාක්ෂිවලට ඇහුම්කන් දීමෙන් පසුවය.

iii. හදිසි නීතිය හා ත්‍රස්තවාදයට එරෙහි නීති ක්‍රියාත්මක වේ. මේ නිසා ස්ථිර තත්ත්වයන් හමුවේ. මහේස්ත්‍රාත්වරු සැකකටයුතු මරණ

සම්බන්ධයෙන් කටයුතු කිරීමට මැදිහත්වීම වැළකී යයි. අතීතයේදී එක්තරා ශ්‍රේණියකට අයත් පොලිස් නිලධාරීන්ට මළ සිරුරු වළදැමීමට ඉඩදෙන්නා වූ රෙගුලාසි ක්‍රියාත්මක විය. මේ තත්ත්වය බලය යොදා සිදුකරන අතුරුදහන් කිරීම්වලට සැබෑ ලෙසින් බලපෑවේය. **මෙවැනි හදිසි හෝ ත්‍රස්තවිරෝධී නීති සැකසීම වැළැක්වීමට පියවර ගත යුතුය. මක්නිසාද එමගින් විනිසුරුවරුන්ට පුද්ගල නිදහස ආරක්ෂා කිරීමට දී ඇති සියලු බලතල ඉවත් කෙරෙන බැවිණි.**

iv. හබයාස් කෝපස් ඉල්ලුම් කිරීමේ ක්‍රියාදාමය තුළ දැඩි සීමා කිරීම් හඳුන්වා දී ඇත. මෙහිදී අධිකරණයට ප්‍රවේශ වීමේ හැකියාව කඩිනම් විය යුතුය. උදාහරණයකට පිලිපීනය දැක්විය හැකිය. පිලිපීනයේ අධිකරණ බල සීමාවෙන් පිටතදී පවා හබයාස් කෝපස් ආඥාවක් ලඟම සිටින මහේස්ත්‍රාත් වරයාගෙන් ඉල්ලා සිටීම දවසේ ඕනෑම වේලාවක සිදුකළ හැකිය. පැහැර ගෙනයාම් සහ අතුරුදහන්වීම් පිළිබඳව චෝදනා කරන අවස්ථාවල ඒවාට මැදිහත්වීමට අධිකරණයට ඇති හැකියාව වැඩි දියුණු කිරීමේදී ඉහත භාවිතාවන් අවශ්‍ය වේ. හබයාස් කෝපස් ආඥා පිළිබඳ නීතිය හා ක්‍රියාදාමයට අදාළ ප්‍රතිපාදන මැනවින් පැහැදිලි කරන්නා වූ නීතියක් අවශ්‍ය වී ඇත.

v. මූලික අයිතිවාසිකම් සම්බන්ධ පෙත්සම් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කිරීම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 126 වන වගන්තිය ප්‍රකාරව සිදුවේ. මේ සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්න උද්ගතව ඇත. මූලික අයිතිවාසිකම් සම්බන්ධ කරුණු කඩිනමින් පිළියෙල කළ යුතු බවට

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම ප්‍රතිපාදන පවතී. නමුත් එවැනි නඩු පිළියෙල කිරීමේ බරපතළ ප්‍රමාදයන් දැකිය හැකිය. මෙවැනි ප්‍රමාදයන්ට හේතුව ලෙස දක්වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ සතු අධික වැඩකටයුතු ප්‍රමාණයයි. මූලික අයිතිවාසිකම් නඩු ඇසීම ප්‍රමාද කිරීමේ බලපාන්නා වූ පුරුද්දක් වර්ධනය වී ඇත. එනම් එකම කරුණ සම්බන්ධයෙන් මහාධිකරණ නඩුව අසා නිමවන තෙක් මූලික අයිතිවාසිකම් නඩු ඇසීම කල් දැමීමයි. මහාධිකරණයේ නඩු ප්‍රමාදය ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු ප්‍රමාද වීමෙහි ලා බලපායි. රටේ විවිධ ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයින්ට ශ්‍රේෂ්ඨාධිකරණයට අදාළ පෙත්සම් සම්බන්ධයෙන් පැමිණීමේ තවමත් දුෂ්කරතා රැසකට මුහුණදීමට සිදුවේ. වර්තමාන වාතාවරනය තුළ ජනතාවට නගරයේ නීතිඥවරුන් මත යැපීමට සිදුව ඇත. නීතිඥවරුන්ට විශාල මුදල් ප්‍රමාණයක් ගෙවීමටද සිදුවේ. මානව හිමිකම් උල්ලංඝනයන්ට මුහුණ දීමට සිදුවේ. වර්තමාන වාතාවරණ තුළ ජනතාවට නගරයේ නීතිඥවරුන් මත යැපීමට සිදුව ඇත. නීතිඥවරුන්ට විශාල මුදල් ප්‍රමාණයක් ගෙවීමටද සිදුවේ. මානව හිමිකම් උල්ලංඝනයන්ට මුහුණදුන් වින්දිතයින්ගෙන් බහුතරය සමාජයේ දුප්පත්ම කොටස් අතරින් පැමිණෙන්නන් වෙති. ඔවුන්ට මෙම ගාස්තු ගෙවීම ඔරොත්තු නොදෙයි. නීති ආධාර ලබා දෙන්නා වූ ඇතැම් ව්‍යාපෘතීන් පවතී. නමුත් ඒවා දක්ෂ සහ කඩිනම් සේවයක් සැපයීමෙහිලා ප්‍රමාණවත් නැත. වැනි ව්‍යාපෘතිවල පරිපාලනයට දූෂණ චෝදනා

රැසක් එල්ල වී ඇත. මෑතක සිට බහුතර නීතිඥවරු මානව හිමිකම්වලට අදාළකරුණු සම්බන්ධයෙන් වූ පැමිණිලි භාර ගැනීමෙන් වැළකී සිටිති. මේ තත්ත්වය පොදු නීතිය සම්බන්ධයෙන් වෙනසක් නොපෙන්වයි. පොදු නීතිය සම්බන්ධයෙන් නඩුවලදී පාලන රෙජිමේන්තුව අධිකරණයට පැමිණීම සහතික කිරීමට සිදුවේ වධහිංසාවට පාත්‍ර වූ වින්දිතයින්ට වන්දි පිරිනැමීමේදී අදාළ වන ශ්‍රේෂ්ඨාධිකරණ රීති මගින් මෙම කරුණු සම්බන්ධයෙන් වූ ජාත්‍යන්තර නීතිය පිළිබිඹු කිරීමක් සිදු නොවේ. ශ්‍රී ලංකාවේ අධිකරණ තුළ ජාත්‍යන්තර සංකල්පයන් හා තත්ත්වයන් සලකා බැලීම අධෛර්යය කිරීමක් සින්ගරාසා නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මගින් තවදුරටත් සිදුවිය.

vi අපහාස නීතිය පිළිබඳ පැහැදිළි නිර්වචනයක් නැත. මේ නිසා පුරවැසියන් සහ නීතිඥවරුන්, අයිතීන් පිළිබඳ කරුණුවලදී දැඩි පෙළඹවීමකින් නඩු පැවරීමට එරෙහිව බියවැද්දීම සිදුවේ.



ටෝනි ප්‍රනාන්දු නඩුවේදී මානව හිමිකම් කමිටුව විසින් සිය තීරණ ලබාදෙන ලදී. (Communic ation 1289/2003) එය ශ්‍රී ලංකා ආණ්ඩුව ක්‍රියාත්මක කිරීමෙන් වැළකිණි. නීතිඥවරු අධිකරණයේ නිලධාරීන්ය. ඔවුන් යුක්තිය පසිඳලීමේ කර්තව්‍ය තුළ අත්‍යාවශ්‍ය කොටසකි. ඉතා අසීරු මානව හිමිකම් උල්ලංඝනයන්වලදී සහ පොදු නීතිය සම්බන්ධ කරුණුවලදී පුරවැසියන්ට ඒ පිළිබඳ උනන්දුවක් දක්වන නීතිඥවරුන් සොයා ගැනීම අසීරුය. මෙය බරපතළ ලෙස යුක්තියට ඇති ප්‍රවේශය අහිමි කිරීමකි. තම සේවා දායකයාගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන්

කාර්යශූර ලෙස සහභාගි වීමට නීතිඥවරුන් තුළ නොහැකියාවක් පවතී. මේ තත්ත්වය ඉතා ලසු වූ දක්ෂතාවය හෝ නීතිඥවරුන්ගේ පාර්ශ්වයෙන් පවතින අකමැත්ත මත රඳේ.

ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වෘත්තිමය සලකා බැලීම මත මෙම අකමැත්ත හටගනී. ඔවුන් අදාළ නඩුවලදී ක්‍රියාශීලී වුවහොත් අහිතකර බලපෑම්වලට මුහුණ දීමට සිදුවේ. අකැමැත්ත සම්බන්ධයෙන් බලපාන්නා වූ තවත් කරුණක් ලෙස බිය වැද්දීම් දක්විය හැකිය. ඔවුන්, බලවත් රාජ්‍ය නිලධාරීන්ගේ සංවිධානාත්මක අපරාධ සිදුකරන පුද්ගලයින් සිදුකරන බියවැද්දීම දක්විය හැකිය. ඔවුහු බලවත් රාජ්‍ය නිළධාරීන්ගේ සංවිධානාත්මක අපරාධ සිදුකරන පුද්ගලයින් සිදුකරන බියවැද්දීම්වලට ඉලක්ක වෙත්. මෙහිදී බලපාන තවත් කරුණකි. ඔවුන්ගේ සේවයට එහෙම පිටින්ම නිසි ගාස්තු නොගෙවීමයි. නීතිඥවරුන් අයිති වෘත්තිමය සංවිධානවල දුර්වලතාවයන් අවබෝධ කරගැනීමද මේ සම්බන්ධයෙන් බලපාන තවත් කරුණකි. එවැනි සංවිධාන වෘත්තිමය අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහන සැලසීම සම්බන්ධයෙන් සලකා බැලුවිට වටිනාකමින් තොරය. ශ්‍රී ලංකාවේ නීතිඥවරුන්ගේ වර්තමාන තත්ත්වය සලකා බැලීමේදී ඉහත කරුණුවල ඒකාරාශී වීමක් දක්නට ලැබේ. නීතිඥවරුන් තම වෘත්තියේ නිරතවීම පිළිබඳව විප්ලවීය දියුණුවක් ඇති විය යුතුය. ඒ සඳහා අධිකරණයේ අව්‍යාජ උනන්දු කිරීම අවශ්‍ය වේ. නීතිඥ සංගම් දැඩි ලෙස නීතිඥවරුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධනේ පෙනී සිටිය යුතුය. මෙවැන්නක් සිදු නොවීම වර්තමාන තත්ත්වය සුබවාදී වෙනසකට මුලපිරීමෙන් වැළකී යයි. බරපතළ ලෙස ආත්මශක්තිය හීනවීමක් මුළු රට තුළ පැතිර ගොසිණි. මේ තත්ත්වය

නීතිඥවරුන් අතරද දැකිය හැකිය. මේ කරුණ සම්බන්ධයෙන් සියලු පුද්ගලයින් සහ සංවිධාන තම සැලකිල්ල යොමු කළ යුතුය. සංවිධානවලට ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයද අයත්වේ. මේ සියලු දෙනා වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් සම්බන්ධයෙන් පවතින අවහිරතාවයට විසඳුම් සෙවීමට උත්සාහ කළ යුතුය.

## සාක්ෂිකරුවන් ආරක්ෂා

ඉ. i. විමර්ශන පැවැත්වීම, නඩු පැවරීම්, අධිකරණයේ කටයුතු සහ නීතිඥවරුන්ගේ වගකීම් සම්බන්ධයෙන් කරුණු සඳහන් කරන ලදී. මේ සියල්ල ඵලදායි වීමට ශ්‍රී ලංකාවේ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීමෙහිලා දැඩි ප්‍රයත්නයක් ගත යුතුය. බෙන්තම් සඳහන් කළේ සාක්සිකරුවන් අධිකරණයේ ඇස් හා කන් බවයි. නෛතික ක්‍රියාදාමය දන්නා පොදු හැඟීමක් ඇති ඕනෑම පුද්ගලයකු සම්බන්ධයෙන්ද, අධිකරණය සම්බන්ධයෙන් වූ මෙම කරුණ සත්‍යයක් වේ. සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව වැඩිදියුණු කිරීමෙහිලා පහත සඳහන් දේ අවශ්‍ය වේ. නඩු පවරන අධිකාරිය සහ අධිකරණයද ඇතුළත් සියලු ආයතනවලට ඇති ආරක්ෂාව හා අධීක්ෂණය කිරීමේ වගකීම් ඉටුකරන පැහැදිලි සහ සම්පූර්ණ නීතියක් නිර්මාණය කළ යුතුය.

සාක්ෂිකරුවන් ආරක්ෂා කරන වැඩපිළිවෙලක් පවත්වා ගෙන යාමට අවශ්‍ය සංවිධානාත්මක වගකීම් එම නීතිය මගින් පැහැදිලිව දැක්වීම අනිවාර්යයි.

සාක්ෂිකරුවන්ට විකල්ප වශයෙන් ආරක්ෂිත නිවාස ලබාදීම, කෙටි කාලීන වශයෙන් හෝ දීර්ඝකාලීන වශයෙන් වාසස්ථාන වෙනස් කිරීමේ හැකියාවට අවශ්‍ය තත්ත්වයන් එම නීතිය මගින් අනිවාර්යයෙන් පැහැදිලි කළ යුතුය. සමහර අවස්ථාවලදී සාක්ෂිකරුවන්ට තම ජීවනෝපායන්හි යෙදීමේදී අවශ්‍ය රහස්‍යභාවය සහ නිර්නාමිකත්වයද මේ නීතිය මගින් සැලසීම අවශ්‍ය වේ. නූතනයේ සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැලසීමට අවශ්‍යයවේ. ව්‍යාජ නාමයන් හෝ ඔවුන්ව හඳුනා ගැනීම අනාවරණය නොකිරීමද ඇතුළත් සියලු දේ එමගින් පැහැදිලි විය යුතුය. එවැනි ක්‍රියාවලියකට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලසීමද එම නීතිය මගින් නිශ්චිතව දැක්වීම අවශ්‍ය වේ. වර්තමාන වාතාවරණය සම්බන්ධයෙන් වෙනසක් කිරීමෙහි ලා මෙම ප්‍රධානතම අවශ්‍යතාව ඉටු කළ යුතුය. එය විශ්වාසනීය ලෙස, සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ක්‍රමවත් වැඩපිළිවෙලක් නිර්මාණය කිරීම මගින් සිදුවේ.



**අධීක්ෂණය**

ඊ) i. මානව හිමිකම් සංවිධාන සහ ජාත්‍යන්තර මානව හිමිකම් අධීක්ෂණයද ඇතුළත් දේශීය මානව හිමිකම් කණ්ඩායම් අධීක්ෂණ කටයුතු කිරීමේදී පවත්නා අවහිරතා ඉවත් කළ යුතුය. ශ්‍රී ලංකාවේ විමර්ශන පවත්වන සහ නඩු පවරන ආයතනවල පවතින අන්තයටම ගිය බිඳවැටුණු වාතාවරණය පැහැදිලි කිරීම අවශ්‍ය වේ. මෙවැන්නක් සඳහා එනම් මානව හිමිකම් උල්ලංඝනය පිළිබඳව අධීක්ෂණය කිරීමේ ප්‍රධාන භූමිකාව සිවිල් සමාජ ක්‍රියාධරයින් සහ ජාත්‍යන්තර මානව හිමිකම් ක්‍රියාධරයින් මත පැවරේ. මෙම අංශවල කටයුතු සිදුවීම කළ

> නොහැක්කකි. වර්තමානයේ එවැනි අධික්ෂණයන් හා පෙළඹවීම් සිදුකරන පුද්ගලයින්ට එරෙහිව බරපතළ සීමා කිරීම් සිදුවේ. ඒවා අතර මරණ තර්ජන කිරීම් සහ එවැනි තර්ජනවල ප්‍රතිඵලයක් ලෙස මරාදැමීම්වලටද ඔවුහු මුහුණ දෙති.

යුද්ධය සහ ව්‍යාජ ආරක්ෂාව සම්බන්ධයෙන් කෙරෙන ප්‍රචාරය පදනම් කරගෙන එවැනි බිය ගන්වන වාතාවරණයක් නිර්මාණය වේ. මේ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශේෂයෙන් ජාත්‍යන්තර මානව හිමිකම් කණ්ඩායම්වලට ප්‍රධාන භූමිකාවක් ඉටු කිරීමට ඇත. එමගින් දේශීය මානව හිමිකම් අධික්ෂකයින්ට සහ කණ්ඩායම්වලට වැඩ කිරීමට හැකි සුවිශාල වටාපිටාවක් නිර්මාණය වේ. ජාත්‍යන්තර අධීක්ෂණ මෙහෙයුමක් අවශ්‍ය වී ඇත. එමගින් මෙම වටපිටාව නිර්මාණය වනු ඇත. එමගින් පුද්ගලයින් රැසකට නිදහසේ රටේ වැඩ කටයුතු කිරීමට හැකි වාතාවරණයක් නිර්මාණය වේ. ජාත්‍යන්තර මානව හිමිකම් අධීක්ෂණය, ස්වාධිපත්‍යයට මැදිහත්වීමක් ලෙස හුවා දැක්වීම වැරදි අදහසකි. ජනතාවගේ ස්වාධිපත්‍යය මහා පරිමාණයෙන් සිදුවන ප්‍රචණ්ඩත්වය සහ බියවැද්දීම් හේතුවෙන් දැනටමත් අතුරුදහන් වී ඇත. ජාත්‍යන්තර අධීක්ෂණ මෙහෙයුමකින් ප්‍රධාන වශයෙන් ම බලාපොරොත්තු වන්නේ මෙම අභ්‍යන්තරව අත්විඳින දේ යළි පිළිසකර කිරීමකි. කාම්බෝජය, නැගෙනහිර ටිමෝරය සහ නේපාලයේ අත්දැකීම් මෙහිලා වැදගත් වේ. එම රටවල ජාත්‍යන්තර මානව හිමිකම් මෙහෙයුමක ඵලදායි බව මැනවින් පෙන්නුම් කර ඇත. එමගින් එම රටවල දේශීයත්වයට පනදුන්නා පමණක් නොව දේශීය සම්පත්වල පැවති අවහිරතාව ඉවත් කිරීමද සිදුවිය.

## ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම අධිතක්සේරුවට ලක් නොකළ යුතුය.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා වන බවට වැරදි වැටහීමක් ලබා දෙයි. මෙය සිදු කරන්නේ රජයයි. එනම් රජය, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසන් සභාවට සුවිශාල වගකීම් පවරා ඇති බවට ප්‍රකාශ කරයි. මානව හිමිකම් කොමිෂන් සභාවේ වර්තමාන සභාපති එස්. ආනන්ද කුමාරස්වාමි ගේ පහත වචන මෙහිදී වැදගත්ය. 'මෙම කොමිසමට ව්‍යවස්ථාදායක, විධායක හෝ පරිපාලන හෝ අධිකරණ බලතල නොමැත.... කොමිසමට ක්‍රියාකිරීමේ බලයද නොමැත. කොමිසම මේ ආකාරයට ප්‍රකාශ කළත් ආණ්ඩුව ජාත්‍යන්තර සමුළුවලදී ප්‍රකාශ කරන්නේ වෙනත් දෙයකි. මානව හිමිකම් සම්බන්ධයෙන් ආරක්ෂාව සැලසීමට නොහැකි අර්බුදකාරීත්වය සම්බන්ධයෙන් වරද, ආණ්ඩුව විසින් මානව හිමිකම් කොමිසම පිට පවරයි. සමහර විට එහි බලතල වැඩි දියුණු කිරීමෙහි ලා නීතියක් සම්මත කිරීමට යන බවද සඳහන් කරයි.

කෙසේ නමුත් මේ සම්බන්ධයෙන් ආසියානු මානව හිමිකම් කොමිසමේ ස්ථාවරය වසර ගණනාවක සිට ප්‍රකාශයට පත් කෙරිණි. පොලිසියේ අපරාධ විමර්ශණයට, නඩු පැවරීම්වලට සහ අධිකරණයේ වගකීම් සම්බන්ධයෙන් ඔම්බුඩ්ස්මන්වරයෙකු මානව හිමිකම් කොමිසමට ආදේශකයක් නොවන බව ඔවුහු ප්‍රකාශ කළහ. දියුණු ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය තුළ ඔම්බුඩ්ස්මන්වරයකු පත්කරනු ලැබේ. නමුත් එසේ කරන්නේ පොලිස් විමර්ශනවලට, නඩු පැවරීමේ ක්‍රියාදාමයන් සහ අධිකරණයේ වගකීම් සම්බන්ධයෙන් ස්ථාවර පදනමක් මත එම ආයතන ස්ථාපිත කිරීමෙන් පසුවය. ඔම්බුඩ්ස්මන්වරයෙකුට තම කටයුතු සිදු කළ

හැක්කේ යුක්තිය පසිඳලීමට අවශ්‍ය යටිතල පහසුකම් සැලසීමෙන් පසුව පමණි. මානව හිමිකම් කොමිසමට මානව හිමිකම් ආරක්ෂා කිරීමෙහි ලා වැදගත් භූමිකාවක් සිදු කිරීමට ඇති බව සම්පූර්ණ මුලාකිරීමකි. අවාසනාවකට ශ්‍රී ලංකාව තුළ දේශීයව මෙන්ම ජාත්‍යන්තරව මානව හිමිකම් සම්බන්ධයෙන් කටයුතු කරන කණ්ඩායම් මෙම බොරුව හෙළිදරව් කිරීමට අසමත්ය.

ඒවාට හැකියාව ඇත්තේ නොවැදගත් දේ සිදුකිරීමටය. උදාහරණ ලෙස රැඳවුම් ස්ථානවලට යෑම, වින්දිතයින් සම්බන්ධයෙන් අදාළ උල්ලංඝනයන් සිදු වූ ආරම්භක අවස්ථාවල වෛද්‍ය, මනෝ ප්‍රතිකාර දීම සහ නීති ආධාර ලබාදීම ඒ අතර වේ. ඊට අමතරව මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සම්බන්ධයෙන් දැඩි ලෙස විවේචනාත්මක හඬක් නඟන ප්‍රකාශකයෙකුගේ භූමිකාවද ඉටු කරයි. කෙසේ නමුත්, වර්තමානයේ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසන් සභාවට සදාචාරාත්මක හෝ ව්‍යවස්ථාපිත විශ්වාසනීයත්වයක් නොමැත. මක්නිසාද එයට පත්කිරීම් සිදුකර ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වූ බැවිනි.




දෙල්ගොඩ ඝාතනයට එරෙහිව ප්‍රදේශයේ අලවා තිබූ පෝස්ටරයක්

# මිනීමැරීම් සාධාරණීයකරණය කරන්නා වූ මතභේදාත්මක විනිශ්චයන්

මෙම ලිපිය අධිකරණ සේවා කොමිසමේ ලේකම්වරයා වෙත යවන ලද්දකි. ගම්පහ මහේස්ත්‍රාත්වරයා, දෙල්ගොඩ සමූල ඝාතනයේදී සැකකරුවන් දෙදෙනෙකු මරා දැමීම පිළිබඳ දෙන ලද තීන්දුව මීට අදාළ විය.



*2007 මැයි 29*
*සුහදගම්ලත් මහතා,*
*ලේකම්*
*අධිකරණ සේවා කොමිසම*
*උසාවි සංකීර්ණය*
*කොළඹ 12*
*ශ්‍රී ලංකාව*
*ෆැක්ස් 94 11 2320785*

*ගම්ලත් මහතා වෙත,*

***දෙල්ගොඩ සමූල ඝාතනයේදී සැකකරුවන් දෙදෙනෙකු මරා දැමීම, සාධාරණ මනුෂ්‍ය ඝාතන ලෙස ප්‍රකාශයට පත් කළ නඩු තීන්දුව***

*පුවත්පත්වල මෙසේ වාර්තා විය. ඊ.ඒ. අමරදාස සහ ඊ.ඒ උපසේන යන සැකකරුවන් මරා දමනු ලැබීය.*

2007 මැයි 26 දින සිදු වූ දෙල්ගොඩ එකම පවුලේ සාමාජිකයින් ඝාතනය කිරීමට මෙම දෙපල සම්බන්ධ බවට චෝදනා එල්ල විය. ඒ සම්බන්ධයෙන් ගම්පහ මහේස්ත්‍රාත්වරයාගේ ප්‍රකාශය පහත පරිදිය. එනම් මෙම මරාදැමීම ආත්මාරක්ෂාව සම්බන්ධයෙන් කළ සාධාරණ මනුෂ්‍ය ඝාතන නොවේ.

මේ සඳහා 2007 මැයි 27 දින The Sunday Times පුවත්පත බලන්න. - පොලිස්කාරයින් සහ මිනීමරුවන් - කවුද භීෂණය රජ කරවන්නේ)

මෙම ලිපිය ආසියානු මානව හිමිකම් කොමිසම වෙනුවෙන් ලියමි. මහේස්ත්‍රාත්වරු පොලිසියේ ප්‍රකාශන මත පමණක් පදනම්ව අදූරදර්ශී තීන්දු ලබා දෙයි. මේ තත්ත්වය යුක්තිය පසිඳලීමේ ඇති කරන්නාවූ බරපතළ අර්බුද සම්බන්ධයෙන් අපි සැලකිලිමත් වෙමු. මෙවැනි තීන්දු, අපරාධ විමර්ශන පිළිබඳ අධිකාරි ආයතන පරීක්ෂණ පැවැත්වීමට පෙර ලබාදේ. එසේම නීතිපති දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂාවට පෙර එය සිදුවේ. නඩුව විභාග කරන අධිකරණය සියලු සාක්ෂි සම්බන්ධයෙන් අධිකරණමය පරීක්ෂාවට පෙර එවැන්නක් ප්‍රකාශයට පත් වේ. මුල් අවස්ථාවේදීම මහේස්ත්‍රාත්වරයා සිදුකරන ප්‍රකාශයේ ප්‍රතිඵලය සියලු පරීක්ෂණ පැවැත්වීම අවසන් කර දැමීමයි. මරාදැමීම් සිදුකළ අය අත වරදක් නොමැති බවත්, ඔවුන් සිදු වූ අපරාධය සම්බන්ධයෙන් අහිංසක බවත්, මෙම ප්‍රකාශයෙන් හැඟවේ.

මෙම විශේෂ සිද්ධිය පිළිබඳ තීන්දු වඩාත් අර්බුදකාරී වේ.

මරා දැමූ පුද්ගලයින් දෙදෙනා මෙම අපරාධයට හවුල්ද? මාධ්‍ය වාර්තාවලින් පවා ඉස්මතුවූයේ සැකයකි. සැබෑ මිනීමරුවන් වසන් කිරීම උදෙසා චූදිත සැකකරුවන් මරා දැමීම සිදුවිය හැක්කකි. සිද්ධිය සිදු වූ ස්ථානය අවට නිවාස කිහිපයක් ගිනිබත් කෙරිණි.

මෙය සාක්ෂි විනාශ කිරීමට කරන ලද්දක් බවට පොලිසියයේ විමර්ෂකවරු කළ පැමිණිලි මඟින් වාර්තා විය.

මෙහිදී මහේස්ත්‍රාත්වරයාගේ භූමිකාව වැදගත් වේ. ආත්මාරක්ෂාව උදෙසා මරාදමන ලද බව කෙනෙකුගේ ස්ථාවරය වන විට, ආරම්භක පරීක්ෂණ කටයුතුවල මුල් අදියර මහේස්ත්‍රාත්වරයාගේ වගකීම යටතේ පවතී. අපරාධ චෝදනාවල විත්තිවාචක අයැදීමේදී වඩාත් සුලභ දෙයක් සිදුවේ.

එම විත්තිවාචකය සියලු පවතින සාක්ෂිවලට විරුද්ධව අයැද සිටී. අපරාධය සම්බන්ධයෙන් සිදුකෙරෙන සියලු අපරාධ පරීක්ෂණමත සාක්ෂි රැඳී ඇත. අපරාධය පිළිබඳ පරීක්ෂණය අපරාධ නඩු විධාන සංග්‍රහයට අනුව සිදු කෙරේ. මරාදැමීම පිළිබඳ අපරාධ විමර්ශනය සිදුකිරීමට පෙර, විත්තිවාචකය මත ඒ පිළිබඳව නිරීක්ෂණයට පැමිණීම මහේස්ත්‍රාත්වරයාගේ කාර්යභාරය නොවේ.

සාමාන්‍ය වැසියකුට විරුද්ධව මිනීමැරීමේ චෝදනා එල්ල වූ අවස්ථාවක් සලකා බලමු. විමර්ශන සම්පූර්ණ කිරීමට පෙර, අදාළ සිද්ධිය සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ හා මහාධිකරණයේ පරීක්ෂණ පවත්වා අවසන් වීමට මත්තෙන් මහේස්ත්‍රාත්වරයාට අදාළ

*විත්තිවාචකය මත පදනම් වෙමින් තීන්දු ප්‍රකාශයක් ප්‍රකාශයට පත් කළ හැකිද?*

සාධාරණ මනුෂ්‍ය ඝාතනයක් ලෙස නම් කරනු ලබන ප්‍රකාශන ඉස්මතු කරන කරුණු කාරණා කිහිපයකි. මෙම ප්‍රකාශ කෙරෙන්නේ පොලිසිය විසින් අවසාන වශයෙන් මිනිසුන් මරා දැමීමෙන් පසුව වගකීම පොලිසිය වෙත පැවරෙන අවස්ථාවලය. අපරාධ පිළිබඳව සැකකටයුතු සියලු පුද්ගලයින් සම්බන්ධයෙන් සම්පූර්ණ පාලනය පොලිසිය සතුවේ. සැකකරුවන් අවි ආයුධ දරා නොසිටින බවට වගකීමද පොලිසිය සතු වේ. ඔවුන් අත්අඩංගුවේ සිටින විට අවි ආයුධවලට ප්‍රවේශය නොමැති බවට වූ වගකීමද පොලිසිය සතුය. සැකකටයුතු පුද්ගලයින් කරන පාපොච්චාරණ මත ඒවා අනාවරණය කර ගැනීමට ඔවුන් බැහැරට ගෙන යාමට සිදුවේ. එවැනි අවස්ථාවල ප්‍රමාණවත් පොලිස් නිලධරීන් සංඛ්‍යාවක් සැපයීම පොලිසිය විසින් සහතික කළ යුතුය. ඔවුන් පොලිසියේ පාලනයේ සිටින බවට, අවශ්‍ය පෙර සූදානම පොලිසිය විසින් ම සහතික කළ යුත්තකි. යම් තර්ජන ඇති වීමක් සලකා බලමු. එවැනි අවස්ථාවක ඔවුන් මෙල්ල කිරීමට පමණක් පොලිසියට අවම බලය යෙදීමේ වගකීම ඇත. සැකකරුවන් දෙදෙනෙකු ආත්මාරක්ෂාව සඳහා පොලිසිය විසින් මරා දැමූ විට අර්ථ ගැන්වෙන්නේ කුමක්ද? වෙඩි තැබීම ආත්මාරක්ෂාව උදෙසා කළ බව ඔප්පු කිරීමට ඔවුන්ට බරපතළ වගකීමක් පැවරේ. එවැනි ඔප්පු කිරීමක් සුදුසු අධිකරණයකදී අපරාධ නඩු විභාගයකදී සිදු විය යුතුය. ශ්‍රී ලංකාවේ නම් සුදුසුම අධිකරණය මහාධිකරණයයි.

මෙම සැකකරුවන් දෙදෙනා මරා දැමීම සම්බන්ධයෙන් වැඩි දුරටත් පරීක්ෂණ අත්‍යාවශ්‍යයි. මහේස්ත්‍රාත්වරයා ආරම්භක අවස්ථාවේදී දුන් තීන්දුව ඉල්ලා අස්කරගත යුතුව ඇත. අපරාධ නඩු විධාන සංග්‍රහයට අනුව පරීක්ෂණ සිදු කිරීමෙහි ලා අවශ්‍ය නියෝගය ලබා දිය යුතුය.

මෙම තත්ත්වයන් අධිකරණ සේවා කොමිසමේ අවධානයට යොමු කරන ලෙස අපි ඔබෙන් අවධාරණයෙන් ඉල්ලා සිටිමු. එවිට ඔවුන් මේ පිළිබඳව තීන්දුවකට එළඹෙනු ඇත. එපමණක් නොව අධිකරණ සේවා කොමිසම තමන්ට සෑහීමකට පත්විය හැකි සුදුසු පියවර ගනු ඇත.

ප්‍රවෘත්ති පත්‍රවල මෑතකදී අඛණ්ඩව වාර්තා වූ දෙයක් ඇත. එනම් මහේස්ත්‍රාත්වරුන් වැඩි දෙනෙක් මේ හා සමාන තීන්දු දී තිබිණි. අපි මේ පිළිබඳව වඩාත් සැලකිල්ල යොමුකර සිටිමු. ආසියානු මානව හිමිකම් කොමිසම සිය වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත්කර ඇත. මෙම කරුණ පිළිබඳ අපගේ නිරීක්ෂණ එහි ඉදිරිපත් කරන ලදී.

'සිද්ධීන් ගණනාවකදී මහේස්ත්‍රාත්වරු මෙවැනි මරාදැමීම් පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණවලින් පසුව ඒවා සාධාරණ මනුෂ්‍ය ඝාතන ලෙස ප්‍රකාශයට පත් කළහ.' පශ්චාත් මරණ පරීක්ෂණ පවත්වන මහේස්ත්‍රාත්වරු මෙහිදී පැහැදිලිවම තම බලයෙන් පරිබාහිරව කටයුතු කර ඇත. මහේස්ත්‍රාත්වරුන් විසින් පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ පහත කොටස් අදාළ වේ.

*'369 වගන්තිය:- සංග්‍රහයේ 370(1) වගන්තියේ ප්‍රතිපාදනවලින් බැහැරව පශ්චාත් මරණ පරීක්ෂණ නොපැවැත්විය යුතුය. 370(1) වගන්තියට අනුව සෑම පරීක්ෂකවරයෙකුට 370 (1) (ඇ) වගන්තියට අනුව, පුද්ගලයකු හදිසියේ මිය ගිය බවට හෝ නොදන්නා කරුණක් මත මිය ගිය විට ඒ පිළිබඳව ඔබට තොරතුරක් ලැබුණු විට මරණයට පත් පුද්ගලයාගේ මළ සිරුර තිබෙන ස්ථානයට යා යුතුය. එහිදී පරීක්ෂණය පැවැත්විය යුතුය. මරණය සිදු වූ බවට පැහැදිලිව පෙනෙන හේතුන් මත වාර්තාවක් පිළියෙල කළ යුතුය. 370(3) වගන්තිය අනුව මෙම වාර්තාව (මහේස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කරන) මගින් අපරාධය සිදු වූ බවට සාධාරණ සැකයක් අනාවරණය වුවහොත් මහේස්ත්‍රාත්වරයා සිවිල් නඩු විධාන සංග්‍රහයේ xiv සහ xv දක්වා ඇති පියවර ගත යුතුය.*



*පොලිසිය අත්අඩංගුවේ සිටියදී සිදුවන මිය යෑම්වලට සිවිල් නඩු විධාන සංග්‍රහයේ 371 වන වගන්තිය අදාළ වේ. 371 වගන්තියේ*

1. *යම් පුද්ගලයකු පොලිසිය හෝ මානසික හෝ ලාදුරු රෝහලක හෝ සිර ගෙයකදී මිය ගියහොත්... වහාම මහේස්ත්‍රාත්වරයාට ඒ පිළිබඳව තොරතුරු ලබාදිය යුතුය. ඒ සමඟ මරණය සිදුවීමට හේතු පිළිබඳ පරීක්ෂණ පැවැත්විය යුතුය.*

ii. *මෙම වගන්තිය යටතේ දක්වෙන අරමුණ යතේ පරීක්ෂණ පැවැත්වීමට මහේස්ත්‍රාත්වරයාට සියලු බලතල ඇත. එනම් අදාළ වරද පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමේ බලය මහේස්ත්‍රාත්වරයාට තිබේ.*

*9 (ආ) (3) වගන්තියෙන් ප්‍රචණ්ඩ ක්‍රියාවලදී හදිසි අනතුරකදී හෝ හදිසියේ සිදුවන මරණවලදී පරීක්ෂණ පැවැත්වීමට මහේස්ත්‍රාත්වරයාට ඇති අධිකරණයේ බලය සාකච්ඡා කෙරේ. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 114 සහ 115 යන වගන්තීන් මගින් සැකකරුවන්ට විරුද්ධව සාක්ෂි ප්‍රමාණවත් නොවන අවස්ථා සහ පැහැදිලි සාක්ෂි ඇති අවස්ථා පිළිබඳව සාකච්ඡා කෙරේ. 114 වගන්තියට සාක්ෂි ප්‍රමාණවත් නොවන හෝ සැකකිරීමට සාධාරණ හේතූන් නොමැති විට පරීක්ෂකවරයා (හෝ මහේස්ත්‍රාත්) සැකකටයුතු පුද්ගලයා ඇප මත නිදහස් කළ යුතුය. ඇප මත නිදහස් වන්නේ මහේස්ත්‍රාත්වරයා වෙත පෙනී සිටීමේ නියෝගයන් මත වේ.*

*'ඉහත කිසිදු ප්‍රතිපාදනයක් මගින් පශ්චාත් මරණ පරීක්ෂණ අවස්ථාවේදී, සැකකරුවකු මුදා හැරීමට මහේස්ත්‍රාත්වරයාට බලය නොදෙයි.'*

*අධිකරණ සේවා කොමිසම උක්ත කරුණ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.*

*ස්තුතියි,*
*මෙයට*

*විශ්වාසී*

***බැසිල් ප්‍රනාන්දු***
*විධායක අධ්‍යක්ෂ*
*ආසියානු මානව හිමිකම් කොමිසම.*



මිත්තනිය ඝාතනය කර තිබූ ආකාරය



මතක වස්ත්‍ර පූජාව